ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# සටහන

30 වෙළුම 7-8 කලාපය 2011 ජුලි - අගෝස්තු




# ආර්ථික පිළිලයකට එරෙහිව

ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා ද්විමාසිකය

# ආර්ථික පිළිලයකට එරෙහිව...

ආර්ථික වෘක්ෂය සරුසාර ව වැඩෙන්නේ අප හැම ගේ සාධනීය ක්‍රියාකාරකම් නිසාවෙනි. කුටුම්බ ද, නිෂ්පාදන ඒකක ද දිවා රෑ නො බලා ආර්ථික කටයුතුවල නිරත වෙති. ඒ ආර්ථික කටයුතු නියාමනය සහ අවශ්‍ය පරිදි පොදු කාර්යයන්ට දායක වීම රජය විසින් සිදු කරනු ලබයි. විධිමත් ආකාරයෙන් ද ඉමහත් කැපවීමෙන් ද කටයුතු කෙරෙන විට එය ආර්ථිකයේ ප්‍රගමණයට හේතු වෙයි. එ නමුත්, මේ ආර්ථික ක්‍රියාකාරකම් නිසි ආකාරයෙන් සිදු කරගෙන යෑම පහසු කටයුත්තක් නො වේ. එම අපහසුතාවට බලපාන ප්‍රධානතම කාරණය වන්නේ ආර්ථික කාර්යයේ ඇති දුෂ්කරතාව යි. එය එ සේ වීම ගැන ගැටලුවක් නැත. එම අභියෝගය ජයගැනීම අප සැම ගේ අනිවාර්යය වගකීම වෙයි. ඒ හමුවේ පසුබට නො වෙන්නෝ ආර්ථික යුද්ධයෙන් ජයගන්නෝ ය.

කෙ සේ වෙතත්, ආර්ථික කාර්යයට බාධකයක් ව ඇත්තේ එහි ගැබ් ව ඇති දුෂ්කරතාව පමණක් නො වේ. එයට විවිධාකාරයෙන් ලෙඩ බෝකරන්නා වූ පලිබෝධයෝ ද වෙති. ඒවා නම් කළ හැක්කේ ආර්ථික පිළිල වශයෙනි. මෙ වර "සටහන" සඟරාවෙන් ඒ ආකාරයේ එක් ආර්ථික පිළිලයක් ගැන සාකච්ඡා කෙරෙයි. එය අන් කිසිවක් නො ව, ව්‍යාජ මුදල් ය.

ව්‍යාජ මුදලේ ඉතිහාසය ඉතා ඈතට දිව යයි. එය මුදලේ ඉතිහාසය තරම් ම දිගු එකකි. මේ දිගු ඉතිහාසය තුළ ව්‍යාජ මුදලට එරෙහි ව ගෙනගිය සටන ද සටහන් ව ඇත. ව්‍යාජ මුදල් ආර්ථිකයට එක් කෙරෙන විට එයට එරෙහි ක්‍රියාමාර්ග ද විවිධාකාරයෙන් පෙරට ආවේ ය. එක් පිළියමක් වූයේ මුදල් නිකුත් කිරීමේ ආධිපත්‍යය තහවුරු කිරීම ය. ඒ උදෙසා එම ආධිපත්‍යයට එරෙහි වූ අයට දඬුවම් පැමිණවීම සිදු කෙරිනි. මරණ දඬුවම පැමිණවීම දක්වා ම ඒවා පැතිර තිබිණි. කවරාකාරයක දඬුවමකින් වුව ව්‍යාජ මුදල් නිපදවීම වැළැක්විය නො හැකි බව අපි දැන් දනිමු. ව්‍යාජ මුදලට එරෙහි ව තාක්ෂණික උපක්‍රම වැඩිදියුණු කිරීමට මූල්‍ය අධිකාරීන් යොමු වී ඇත්තේ එ බැවිනි. ඒ අනුව, ව්‍යාජ මුදල් නිෂ්පාදකයන්ට අනුකරණය කළ නො හැකි ඉතා දියුණු තාක්ෂණික ක්‍රම භාවිතයට පැමිණ ඇත. එම තාක්ෂණික වැඩිදියුණු කිරීම් ගැන ද අපි දැනුම්වත් ව සිටිමු. එයින් නො නැවත, ඒවා ගැන ඉගෙනගනිමු. "සටහන" සඟරාව ද ඒ වෙනුවෙන් විටින් විට දායක වී තිබේ.

ව්‍යාජ මුදල් සංසරණයට එක්වීම තුළින් සමාජ පදනම් බිඳ වැටෙන බව අමුතුවෙන් විස්තර කළ යුතු නො වේ. කෙ සේ වෙතත්, ව්‍යාජ මුදලේ ඇති මෙම භයානක බව යුද්ධයේ දී උරගා බලා ඇති බව අප බොහෝ දෙනකුට ආගන්තුක ය. කඩුවකින්, තුවක්කුවකින්, බෝම්බයකින් බිම හෙළිය හැක්කේ ඒවාට සෘජු ව ම ගොදුරු වන අය පමණකි. ජපානයට හෙළූ න්‍යෂ්ටික බෝම්බවලින් පවා එයට ගොදුරුවූවෝ පමණක් ම විපතට පත්වූහ. එහෙත් ව්‍යාජ මුදල් ආයුධයක් ලෙසින් භාවිතා කළ විට එ මඟින් සමාජයක් මුළුමනින් ම බිඳ දැමිය හැකි ය. මෙ වර "සටහන" සඟරාවෙහි පළ කොට ඇති ව්‍යාජ මුදලේ අනතුරුදායක බව කියැවෙන ලිපියෙන් එම කාරණය පිළිබඳ ව ද විස්තරාත්මක ව කරුණු විමසා බැලෙයි. ✪


**සටහන** ISSN 1391-3697

2011 ජුලි / අගෝස්තු

පිටපතක මිල : රු. 10.00

වාර්ෂික දායකත්වය : රු.240.00 (තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එව්මෙන් 'සටහන' තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ


ලිපි යොමුව


| ලිපි යොමුව | පිටුව |
|---|---|
| සමාජ පදනම බිඳ දමන ව්‍යාජ මුදල් | 3 |
| කාසි පුරාණය | 9 |
| විදේශ විනිමය වෙළඳපොළ හා සම්බන්ධිත ව්‍යුත්පන්න | 16 |
| නව වදන් තනමු | 20 |



"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

## සමාජ පදනම බිඳ දමන ආර්ථික පිළිලය

# ව්‍යාජ මුදල්

**විනීතා හේරත්**

සන්නිවේදන දෙපාර්තමේන්තුව

සැබෑව සහ බොරුව එකිනෙකින් වෙන් කොට හඳුනා ගැනීම පහසු කටයුත්තක් නොවේ. මන්ද, බොරුව අප ඉදිරියේ පෙනී සිටින්නේ ද සැබෑවේ ස්වරූපයෙන් ම වන නිසා ය. ඒ නිසා අපි බොහෝ විට සැබෑවේ ස්වරූපයෙන් වෙස්වලා සිටින බොරුවට අසුවන්නෙමු. ඒ මඟින් නොයෙකුත් දුෂ්කරතාවන්ට මුහුණපාන්නෙමු. අවදානම්වලට ලක්වන්නෙමු. පාඩු ලබන්නෙමු. එහෙත් බොරුවට උත්පත්තිය දෙන්නෝ ඊට පරස්පර ව යමින් බොරුවෙන් ඉමහත් ලාභ ලබති. වාසි ලබති. එහෙත් එ කී ලාභ සාධාරණ ව හෝ නීත්‍යානුකූල ලෙස හෝ උපයන ඒවා නො වේ. තවෙකකු රවටා වංචනික ලෙස උපයන ලාභ ය. නීතිවිරෝධී ලෙස උපයන ලාභ ය. සදාචාරයට එරෙහිව යමින් උපයන ලාභ ය. මේ බොරු, සැබෑවේ ස්වරූපයෙන් විවිධ මුහුණුවරින් අප අතරට පැමිණෙයි. ජනප්‍රිය වෙළෙඳ නාම ඇති නිෂ්පාදන අනුකරණය, විවිධ ලිපි ලේඛන, නිබන්ධන, කලාත්මක නිර්මාණ, ඖෂධ වර්ග මෙසේ අපේ ඇස රවටා අප මුලාවට පත් කරන අනුකරණවලින් කිහිපයකි. ව්‍යාජ නිෂ්පාදනය ලොව භයානක අපරාධ අතර එකක් ලෙස සැලකෙයි. මේවාට එරෙහිව වැට බැඳීමට සෑම රටක ම පාහේ නීති ද පැන නැඟෙයි.

මුදල් සම්බන්ධ තත්ත්වය ද මෙය ම ය. අපි අපේ කායික මානසික ශ්‍රමය වෙහෙසා මුදල් උපයන්නෙමු. අපේ දෛනික ජීවිතයේ අවශ්‍යතා සපුරා ගැනීමට මේ මුදල් වියදම් කරන්නෙමු. අනාගතය වෙනුවෙන් ආයෝජනය කරන්නෙමු. එහෙත් අප සාධාරණ ලෙස උපයන මුදලට එරෙහි ව යමින් කූඨ ලෙස මුදල් උපයන්නෝ සැබෑ මුදලේ ස්වරූපය අනුකරණය කරමින් ව්‍යාජ මුදල් නිෂ්පාදනය කරති. මෙම ව්‍යාජ මුදල් සැබෑ මුදල් ආකාරයෙන් සංසරණයට පැමිණෙයි. එය අදක ඊයෙක සිදුවූවක් නොවේ. මුදලෙහි ඉතිහාසය කෙතෙක් ඈතට දිවයන්නේ ද ව්‍යාජ මුදල් සම්බන්ධ ඉතිහාසය ද එ පමණ ම ඈතට දිවයයි. එ මෙන් ම ව්‍යාජ මුදල් නිෂ්පාදනයට සම්බන්ධවන්නන්ට එරෙහි නීති සහ දඬුවම් පැමිණවීම්වල ඉතිහාසය ද ඊට සමගාමීව දිවයයි.

**ව්‍යාජ මුදලේ ඉතිහාසය**

අද අපට බහුලව ම අසන්නට දකින්නට ලැබෙන්නේ ව්‍යාජ මුදල් නෝට්ටු පිළිබඳවයි. එහෙත් ව්‍යාජ මුදල්, නෝට්ටුවලට පමණක් සීමා වී නැත. නෝට්ටු භාවිතයට පැමිණීමට පෙර පැවතියේ ගනුදෙනු සඳහා කාසි භාවිතා කිරීමයි. එයට පෙර භාණ්ඩ මුදල් ක්‍රමය භාවිතයේ පැවති අතර එම ක්‍රමයේදීත් භාණ්ඩ මුදලේ වටිනාකම වැඩි කොට දැක්වීමට නොයෙකුත් ආකාරයේ වංචනික ක්‍රම යොදා ගැනිනි. මෙයට උදාහරණයක් ලෙස ඇමෙරිකාවේ ස්වදේශික ජනයා ගනුදෙනු සඳහා භාවිතයට ගත් වම්පුම් (Wampum) ලෙස ඇල්ගොංකියානු භාෂාවෙන් හැඳින් වූ සිප්පි/පබලු වැල් දැක්විය හැක. ගනුදෙනුවල දී නිල් - කලු පැහැති සිප්පි වටිනාකමින් වැඩි ඒවා ලෙස සැළකුණු අතර සුදු පැහැ සිප්පි එතරම් වටිනා ඒවා ලෙස නොසැළකිනි. එහෙත් ඇතැම්හු ඒවා වටිනා ලෙස අඟවා වැඩි වටිනාකම් පියවීම සඳහා යොදා ගැනීමට නිල් - කලු සිප්පි ලෙස හැඟවෙන සේ ඒවා වර්ණ ගැන්වීමෙන් ව්‍යාජ මුදල් ලෙස ඒවා යොදාගත්හ.

විධිමත් අධිකාරියක් යටතේ නීත්‍යනුකූල මුදල් නිෂ්පාදනයේ ඉතිහාසය අවුරුදු 2700 ක් තරම් ඈතට දිවයයි. එතෙක් සම්මතයෙන් පිළිගත් බොහෝ දෑ ගනුදෙනු සඳහා හුවමාරු මාධ්‍යය ලෙස යොදාගැණිනි. මුදල් ලෙස කාසි භාවිතය ක්‍රි. පූ. 600 දී පමණ ග්‍රීසියේ ලිඩියාවේ දී ඇරඹිනැයි විශ්වාස කෙරේ. වෙළෙඳාමේ ව්‍යාප්තියත් සමඟ, සරල ආර්ථික ක්‍රම ක්‍රමයෙන් සංකීර්ණ ආර්ථික බවට පත්වීමත් සමඟ ගනුදෙනු සඳහා මුදල් භාවිතයට ගැනීමට බොහෝ රටවල් විසින් පියවර ගැණිනි. එය වසරකින් දෙකකින් සිදු වූවක් නොවේ. සියවස් ගණනාවක් පුරා නොයෙකුත් වෙනස්කම්වලට ලක් වෙමින් විවිධාකාර සොයා ගැනීම් හරහා ආ ඉතා දීර්ඝ ගමන් මඟකි. ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ ගමන් මඟ ද එසේ ම ය. සෑම රටක ම පාහේ බලධාරීන් එයට එරෙහි ව කෙතෙක් විධිවිධාන පැනවූව ද එ දා මෙ දා තුර ව්‍යාජ මුදල් නිෂ්පාදනය මුලුමනින් ම වැලැක්වීමට සමත්වූවෙක් නැත. ඊට හේතුව

තාක්ෂණයේ සිදුවන නොයෙකුත් වැඩිදියුණුවීම් නෛතික බලය ලත් මුල්‍ය බලධාරීන් විසින් මෙන් ම ව්‍යාජ මුදල් නිපදවන්නන් විසින් ද එක හා සමාන අයුරින් ම ප්‍රයෝජනයට ගැනීමයි. වර්තමානයේ ඇතැම් ව්‍යාජ මුදල්වල නිමැවුම සැබෑ නිමවුමේ අනර්ඝත්වය ද ඉක්මවා යන අවස්ථා දක්නට ලැබේ.

මුදල් ලෙස ලෝහ කාසි භාවිතය ඇරඹීමත් සමඟ ම ව්‍යාජ ලෝහ කාසි නිෂ්පාදනයත් ඇරඹී ඇත. එ වකට බොහෝ රටවල කාසි නිෂ්පාදනය සඳහා රන් හා රිදී වැනි වටිනා ලෝහ වර්ග භාවිතයට ගැණිනි. කාසි නිෂ්පාදනය අද මෙන් මුලුමනින් ම යන්ත්‍රසූත්‍ර භාවිතයෙන් සිදු නො වූ එ කල ඇතැම් විට කාසිවල නිමාව එකිනෙකට සමවීමක් දක්නට නොවුනි. ලෝහ තැලීමෙන් කාසිවල හැඩය ලබාගත් අතර මේ නිසා ම කා-සිවල වටයෙහි සම බවක් නොවුනි. එයින් එල නෙළා ගත්තෝ රන් හා රිදී කාසිවල වටය සැස මෙම අනර්ඝ ලෝහ වෙනත් නොයෙකුත් කටයුතු සඳහා යොදාගත්හ. මෙය මුදල් සම්බන්ධ මහජන විශ්වාසය බිඳීයෑමට හේතු විය.



**හතරවන සියවසේ දී පමණ ටංකනය කළ රෝමානු රිදී කාසියක් සැස ඇති ආකාරය**

උදාහරණ වශයෙන් සිලිමක් වටිනා කාසියක සිලිමක් වටිනා රිදී තිබිය යුතු වුව ද වංචනික පුද්ගලයන්ගේ අතින් අතට හුවමාරුව සඳහා මෙම කාසි පත්වෙද්දී වඩවඩාත් එම කාසි සැස රිදී ඉවත්කර ගැනීම සිදුවිය. ඒ අනුව කලක් යන විට ඒවායේ මුහුණත අගය සහ නෛසර්ගික වටිනාකම සම නොවුනා පමණක් නොව ඒ දෙක අතර පරතරය දිනෙන් දින ම පුළුල්වන්නට ද විය. ව්‍යාජ කාසි නිපදවන්නෝ ද මේ ලෙසින් රන් හා රිදී කාසිවලින් ලෝහ ඉවත්කර ඒවා බාල ලෝහ වර්ග හා මිශ්‍ර කිරීමෙන් ව්‍යාජ කාසි නිපදවූහ. බාල ලෝහ වර්ගවලින් කාසි සකසා වටිනා ලෝහ වර්ග ආලේප කිරීමෙන් ඒවාට සැබෑ කාසිවල ස්වරූපය ගැන්වීම එ කල ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ ස්වරූපය විය. ගනුදෙනු සඳහා මුලින් ම කාසි භාවිතයට ගත් රටක් වූ පැරණි රෝමයේ ව්‍යාජ මුදල් ඉතාමත් ම සුලබ විය. මෙම ව්‍යාජ කාසි ෆෝරි (Fourrée) යනුවෙනි හැඳින්විනි.

### ෆෝරි

ෆෝරි ව්‍යාජ කාසි නිෂ්පාදනය සඳහා ක්‍රම කිහිපයක් යොදා ගෙන ඇත. සාමාන්‍ය ක්‍රමය වූයේ තඹ තහඩුවක් ගෙන එය රිදී තට්ටුවකින් ආවරණය කර එය රත්කර කාසියේ සැලසුම සහිත අච්චුව තබා තදින් තැලීමෙන් කාසි සකසා ගැනීමයි. කාසිය හොඳින් රත්කර අච්චුව ඊට මැනවින් තබාගත් කල ඒවා සැබෑ කාසි ස්වරූපයෙන් ම නිෂ්පාදනය කළ හැකිවිය. ෆෝරි ව්‍යාජ කාසි සකසන තවත් ක්‍රමයක් වූයේ කාසිය සාදා ඊට උඩින් රිදී ආලේප කිරීමයි. මෙ මඟින් රිදී භාවිතය තවදුරටත් අඩුකරගත හැකි විය. එම නිසා එය වඩාත් ලාභදායී විය. මෙම ක්‍රමයේ දී කාසිය රිදී දියරයේ ගිල්වීමෙන් ද ඇතැම් විට කාසි මත බුරුසුවකින් රිදී ආලේප කිරීමෙන් ද රිදී කුඩු ඉසීමෙන් ද කාසි රිදී ගැන්වීම කර ඇත.

මුදල් පිළිබඳ මහජන විශ්වාසය රැක ගැනීමට ව්‍යාජ කාසි හඳුනා ගැනීමෙහි ලා එ කල ද විවිධ උපක්‍රම යොදාගෙන ඇත. ඉන් එක් ක්‍රමයක් වූයේ කාසි කිරා බලා ඒවා සැබෑ බරින් යුක්ත දැයි විමසා බැලීමයි. කාසිය නියමිත බරින් අඩුවීම හෝ වැඩිවීම හෝ මඟින් ඒවා ව්‍යාජ කාසි බව හඳුනාගත හැකි විය. ව්‍යාජ කාසි හඳුනා ගැනීමේ තවත් ක්‍රමයක් වූයේ කාසිය යම් ඝන තලයකට අත හැරීමෙන් එයින් නැගෙන ශබ්දය ශ්‍රවණයෙන් ඒවා හඳුනා ගැනීමයි. එහෙත් මෙම ක්‍රමයේ දී කාසි පලුදුවීම්වලට කැඩී බිඳීයෑම්වලට ඇති ඉඩකඩ නිසා ව්‍යාජ කාසි හඳුනා ගැනීමෙහි ලා එය ප්‍රශස්ත ක්‍රමයක් නොවීය. ව්‍යාජ කාසි හඳුනා ගැනීමේ ප්‍රශස්ත ම ක්‍රමය වූයේ කාසියේ අභ්‍යන්තරයේ ඇති ලෝහ වර්ගය කුමක්දැයි බැලීමට හැකි ක්‍රමයක් භාවිතා කිරීමයි. කාසිය සිදුරු කළහොත් හෝ එය අභ්‍යන්තරය දක්වා ගෙවී ගිය හොත් හෝ අභ්‍යන්තතරයේ ඇති ලෝහ වර්ගය කුමක් දැයි දැක ගැනීමට හැකි විය. මේ නිසා ම පැරණි කාසිවල ඇතුළට කා වැද්දූ නියන් පහරවල් දක්නට ලැබේ. මෙම නියන් පහරවල් සහිත කාසි ක්‍රි. පූ. පළමු හා ක්‍රි. ව. පළමු ශත වර්ෂවල දැකිය හැකි විය. කාසි නිෂ්පාදනය සඳහා යොදාගත් තාක්ෂණික වැඩි දියුණු කිරීම් ද ව්‍යාජ කාසි නිෂ්පාදනය වැලැක්වීම සඳහා උපක්‍රම ලෙස යොදා ගෙන ඇත.

ඒ අනුව මුදල් නිෂ්පාදනයේ දී යොදාගත් තාක්ෂණික ශිල්පීය ක්‍රම වෙනස් කිරීමත් වඩාත් සියුම් ක්‍රම යොදා ගැනීමත් සිදු කෙරිණි. යම් යම් කටයුතු සඳහා කාසි පලුදු කිරීම නවතා ලනු වස් 1662 දී එංගලන්තය යන්ත්‍ර භාවිතයෙන් කාසි නිපදවීමට පියවර ගත්තේ ය. එ මඟින් කාසිවල වට දාරය කැටයමින් හැඩ ගැන්වීම ඇරඹිනි. එය ව්‍යාජ මුදල් නිපදවන්නන්ට තම කටයුතු කරගෙන යෑමට යම් තරමක අවහිරයක් ඇති කළේය. එහෙත් ශත වර්ෂය අවසන් වන තෙක් ම පැරණි මුදල් භාවිතයේ තිබුණු අතර ඒවා අඛණ්ඩ ව සැසීමට ද ලක් විය. ඒ අනුව 1695 පමණ වන විට පැරණි කාසිවල බර මුදල් සහින්නන් විසින් ඒවායේ මුල් බරින් අඩක් දක්වා අඩුකර තිබිණි. මේ අනුව මෙම ගැටලුව මුලුමනින් ම විසඳීම සඳහා අතින් නිමවූ පැරණි කාසි මුලුමනින් ම සංසරණයෙන් ඉවත්කිරීමට පියවර ගෙන ඇත.

මුදල් නිෂ්පාදනය විධිමත්කිරීම සඳහා කාසි ටංකන අධිපති තනතුර ඇති කරන ලද අතර එය පැවරුණේ අයිසෙක් නිව්ටන් හට ය. රාජකීය ටංකනයෙහි අධිපති ලෙස අයිසෙක් නිව්ටන් ව්‍යාජ මුදල් සෙවීමේ කටයුත්තෙහි ලා සුවිසල් මෙහෙයක් ඉටුකළේ ය. සුරාසැල් වැනි ස්ථානයන්හි වෙස්වලා නිතර ගැවසෙමින් මේ පිළිබඳ බොහෝ තොරතුරු රැස්කළේ ය. 1696

මහ පුනර් ටංකන අවධියෙහි භාවිතයේ පැවති කාසිවලින් සියයට විස්සක් පමණ ම ව්‍යාජ කාසි බැව් හේ හඳුනා ගත්තේ ය. 1698 ජුනි - 1699 දෙසැම්බර් දක්වා ව්‍යාජ මුදල් සම්බන්ධයෙන් ඔහු සැකකරුවන්, විත්තිකරුවන් සහ ඔත්තුකරුවන් 100 දෙනෙකුගෙන් විමසීම්කර ඇත. ව්‍යාජ මුදල් නිෂ්පාදනය කළ 28 දෙනෙකුට එරෙහිව අධි චෝදනා ඉදිරිපත් කළේ ය.

මෙම කාලයෙහි පැරිසියෙහි සහ ඇම්ස්ටර්ඩෑම්හි රිදී වටිනාකම ලන්ඩන්හී රිදී කාසිවල මුහුණත වටිනාකමට වඩා වැඩිවූයෙන් රිදී කාසි විශාල ප්‍රමාණයක් උණුකර ඒවා පිටරට යැවීම ද සිදු විය. කෙ සේ වෙතත් 20 වන ශත වර්ෂයේ මැද වන තෙක් ම කාසි නිෂ්පාදනය සඳහා රන් හා රිදී වැනි වටිනා ලෝහ භාවිතය සිදු වුව ද පසුව කාසි සඳහා වටිනාකමින් අඩු තඹ, පිත්තල හා නිකල් වැනි ලෝහ වර්ග භාවිතය ඇරඹිනි. මේ මඟින් කාසිවලින් ලෝහ කොටස් ඉවත් කර ගැනීම සඳහා ඒවා පලුදුකිරීම නවතාලිය හැකි වුව ද ව්‍යාජ මුදල් නිෂ්පාදනය ඉන් නතර කළ නො හැකි විය. මන්ද, මුදල් ලෙස කාසි භාවිතයට අමතර ව නෝට්ටු භාවිතය පැමිණීමත් සමඟ ම ව්‍යාජ නෝට්ටු සැකසීම ඇරඹීම නිසා ය. මුදල් නෝට්ටු භාවිතය විසින් ව්‍යාජ මුදල් නිෂ්පාදනය වඩාත් පහසු කරන ලද අතර දිනෙන් දින වේගයෙන් දියුණුවට පත් තාක්ෂණය විසින් එයට මනා පරිසරයක් ද සකසන ලදී.

මුලින් ම ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය පළමු මුදල් නෝට්ටු මුද්‍රණය කළ චීනයේ ම සිදු විය. මේ නිසා "ව්‍යාජ මුදල් නිපදවන්නන්ට මරණ දඬුවම" යන්න මුදල් නෝට්ටුවල සඳහන් කිරීමට පියවර ගෙන ඇත. ව්‍යාජ මුදල් නිපදවූවන්ට මරණ දඬුවම පැමිණ වූ අතර තොරතුරු ලබාදුන් අයට වටිනා ත්‍යාග පිරිනැමිණි. එ මතු නොව ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ යෙදුණු අපරාධකරු සතු වූ සියලු ධනය ද ඒ පිළිබඳ තොරතුරු සැපයූ අයට හිමිවිය.

ව්‍යාජ මුදල් නිෂ්පාදනය හුදු ලාභ පරමාර්ථයෙන් කෙරෙන කේවල ව්‍යාපෘතියක් ලෙස මෙන් ම මහා පරිමාණයෙන් යුධ උපක්‍රමයක් ලෙස ද කරනු දක්නට ලැබේ. එ මෙන් ම තම රටේ මුදල් අනුකරණය කරමින් ව්‍යාජ මුදල් නිපදවීමත් වෙනත් රටවල මුදල් අනුකරණය කරමින් ව්‍යාජ මුදල් නිපදවීමත් දක්නට ලැබේ. මේ දෙ ආකාරයෙන් ම ව්‍යාජ මුදල් නිපදවීම් පිළිබඳව බොහෝ රටවලින් තොරතුරු වාර්තා වී ඇත.

තම රටේ ම මුදල් අනුකරණයෙන් ව්‍යාජ මුදල් නිපදවීම ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් ද ත්‍රස්තවාදී කටයුතු සඳහා යොදාගැනීමට ද කරයි. 1848 ලන්ඩනයට සරණාගතයින් ලෙස පලාගොස් සිටි හංගේරියානු කැරලිකරුවන් විසින් ත්‍රස්තවාදී කටයුතු සඳහා යොදාගැනීමට ඔස්ට්‍රෝ - හංගේරියන් මුදල් මුද්‍රණය කර ඇත. මේ පිළිබඳ ව තොරතුරු හෙළදරව් වූ පසු මොවුනට රැකවරණය සැලසූ එංගලන්තය ඔවුන් ඔස්ට්‍රියාවට බාරදීම ප්‍රතික්ෂේප කර ඇත. මෙ වැනි ම පුවතක් 1896 දී කොස්ටාරිකාවෙන් වාර්තා වී ඇත. මෙයට මුල් වී ඇත්තේ කොස්ටාරිකානු ජාතික ෆෙඩ්රික් මෝරා නමැත්තා ය. ඔහු කොස්ටාරිකාවෙහි ජාතික වීරවරයෙක් ලෙස සැලකුණු ජුආන් රෆායල් මෝරා ගේ බෑණනුවන් ය. එ වකට පැවති රෆායෙල් ඉග්ලේසියා ගේ රජයට එරෙහිව ෆෙඩ්රික් මෝරා නිව්යෝර්ක් සිට ව්‍යාජ මුදල් නිපදවා ඇත. මේ සඳහා ඔහු නිව්යෝර්ක්හී ස්පාක්ස්ඩ - ඇමෙරිකා මුද්‍රණ සමාගමක් ද දාන් නමැති ලිතෝ මුද්‍රණ ශිල්පියකු ද කුලියට ගෙන එක්සත් ජනපද ඩොලර් 1,000,000 ක් වටිනා කොස්ටාරිකා මුදල් නෝට්ටු මුද්‍රණය කළේ ය. එහෙත් මෙම නෝට්ටු සෝෆාවක සඟවා කොස්ටාරිකාවට එවීමට තැත් කිරීමේ දී එහි රේගුවට අසුවීමෙන් මෙම දැවැන්ත මුදල් වංචාව පිළිබඳ තොරතුරු හෙළි විය.

වෙනත් රටක මුදල් අනුකරණය කරමින් ව්‍යාජ මුදල් නිපදවීම බොහෝ විට පරමාර්ථ තුනක් මුල් කරගනිමින් කරනු දක්නට ලැබේ. ඒ විරුද්ධවාදී රටවල් අධෛර්යමත් කිරීමට, සතුරු රටවල ආර්ථික බිඳ හෙළීමට සහ ගනුදෙනු සඳහා මුදල් ලෙස භාවිතා කිරීමට ය. සතුරු රටවල මුදල් අනුකරණය කරමින් ඒවා ව්‍යාජ ලෙස නිපදවා එම ආර්ථික තුළට විශාල ප්‍රමාණවලින් ඒවා ගලා යෑමට සැලස්වීමෙන් මුදලෙහි මූර්ත වටිනාකම විශාල ලෙස පහළට ඇද වැටීමට ඉඩසැලසීම මේ මඟින් සිදුකෙරිනි.

**යුධ උපක්‍රමයක් ලෙස ව්‍යාජ මුදල් භාවිතය**

යුධ උපක්‍රමයක් ලෙස ව්‍යාජ මුදල් භාවිතා කළ අවස්ථා රැසක් ඉතිහාස ගත ව ඇත. ඇමෙරිකානු නිදහස් සටන, ඇමෙරිකානු සිවිල් යුද්ධය, රුසියන් විප්ලවය, පළමුවන ලෝක සංග්‍රාමය, දෙවන ලෝක සංග්‍රාමය, වියට්නාම් යුද්ධය මේ අතුරින් කිහිපයකි. යුධ උපක්‍රමයක් ලෙස ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ දී එ කී මුදල් සතුරු රටවල සංසරණය සඳහා මුදා හැර එම රටවල ආර්ථික බිඳ හෙළීමට භාවිතාකොට ඇත. එ පමණක් නොව එම රටවල ජනතාව වෙත පණිවුඩ නිකුත් කිරීමට ද ව්‍යාජ මුදල් යොදාගෙන ඇත. බොහෝ විට මෙම පණිවුඩ හරහා එම රටවල බලයේ සිටින රජය ජනතා අප්‍රසාදයට පත්කිරීමත් ඒ මඟින් ඔවුන ගේ සහයෝගය රජය වෙත ලබා නො දීමත් අරමුණු කොට ඇත. ඇතැම් අවස්ථාවල මෙම පණිවුඩ නෝට්ටු සමඟ වෙන වෙනමත් ඇතැම් අවස්ථාවල නෝට්ටුවට ම සම්බන්ධව ඉන් කපා වෙන් කළ හැකි තීරුවක් ලෙසත් මුද්‍රණය කර තිබෙනු දක්නට ලැබේ. බොහෝ විට මෙවැනි පණිවුඩ ඇතුළත් ව්‍යාජ මුදල් නෝට්ටු ගුවන් මඟින් සතුරු රටවලට හෙළා ඇත. ඇෆ්ඝන් යුධ අවස්ථාවෙහි එක්සත්




**වියට්නාම් යුද්ධයේදී ප්‍රචාරක කටයුතු සඳහා අමතර තීරුවක් මුද්‍රණය කර ගුවනින් හෙලූ Don නෝට්ටුවක්**

ජනපදය මෙම උපක්‍රමය අනුගමනය කර ඇත. ව්‍යාජ මුදල් නෝට්ටු හරහා එවන ලද පණිවුඩ මඟින් එම මුදල් ලබාගෙන යුධ කටයුතුවලින් ඉවත් වී සිටින ලෙස ජනතාවට දැනුම් දී ඇත. වියට්නාම් යුද්ධයේ දී මෙවැනි ම ආකාරයෙන් ජනතා සහයෝගය තමන් වෙත නම්මා ගනුවස් එක්සත් ජනපදය, ව්‍යාජ ඩොන් (Don) මුදල් වියට්නාම් ජනතාව වෙත ගුවනින් හෙළීමත් ඒ සමඟ ම පණිවුඩ යැවීමත් කර ඇත.

## ඇමෙරිකානු නිදහස් සටන

ඇමෙරිකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ව පැවති අවදියේ එහි පවුම්, සිලිං සහ පැන්ස මුදල් ඒකක ලෙස භාවිතයට ගැණිනි. එහෙත් ඒවායේ වටිනාකම ජනපදයෙන් ජනපදයට වෙනස් විය. උදාහරණ වශයෙන් මැසචුසෙට් (Massachusetts) පවුම පෙනිසිල්වේනියා (Pennsylvania) පවුමට සම නො වී ය. සියලු ම යටත් විජිත පවුම් බ්‍රිතාන්‍ය ස්ටර්ලින් පවුමට වඩා අගයෙන් අඩුවිය. පසුව එකිනෙක යටත් විජිත තම තමා ගේ ම වූ මුදල් නිකුත් කිරීම ආරම්භ කළහ.

1775-1783 ඇමෙරිකානු නිදහස් සටන, බ්‍රිතාන්‍ය යටත් විජිත බවට පත්ව තිබූ උතුරු ඇමෙරිකානු ජනපද 13 ක් විසින් බ්‍රිතාන්‍ය යටත් විජිත භාවයෙන් මිදීම සඳහා ගෙන ගිය අරගලයයි. මෙම අවස්ථාවෙහි මහද්වීපික සංගමය (කොන්ටිනෙන්ටල් කොන්ග්‍රසය) Continental Currency නැතහොත් Continentals මුදල් නෝට්ටු මුද්‍රණය කොට සංසරණයට මුදා හැරීම ආරම්භ කළා ය. මෙම මුදල් ඩොලර් ලෙස නම් කරන ලද අතර ඩොලර් 1/6 - 80 දක්වා පරාසයක නෝට්ටු නිකුත් කිරීමට පියවර ගත්හ. යුධ අවශ්‍යතා සඳහා අරමුදල් ලබාගැනීමට ඩොලර් 250,000ක් මුද්‍රණය කරන ලද අතර ඒවා ඉතාමත් ම පහසුවෙන් අනුකරණය කළ හැකි මට්ටමේ ඒවා විය. එයින් ඵල නෙලාගත් මහා බ්‍රිතාන්‍යය, ඩොලරයෙහි (Continental Dollar) අගය පහළ හෙළීමට ව්‍යාජ ඩොලර් මුද්‍රණය කොට ඇමෙරිකා වෙළෙඳපොළට මුදා හැරීමට කටයුතු කොට ඇත. මේ නිසා එහි වටිනාකම සැලකිය යුතු තරමින් පහළ වැටුණි. 1778 දී ඩොලරයෙහි අගය මුහුණත වටිනාකමින් 1/5 – 1/7 ක් විය. 1780 වන විට වටිනාකම 1/40 ක් විය. මෙසේ මුදලේ අගය කෙතරම් දුරට අවප්‍රමාණය වී ද යත් 1779 දී කොන්ග්‍රසය මේ මුදල් තවදුරටත් මුද්‍රණය කිරීමෙන් ඵලක් නැති බවට තීරණය කළේ ය. ඒ අනුව ඔවුහු පැරණි මුදල් ඉවත් කර අලුතින් රන් හා රිදී කාසි නිෂ්පාදනයට පවා යොමුවූහ. මන්ද ඒවා ව්‍යාජ මුදල් ලෙස නිපදවීම පහසුවෙන් කළ නො හැක්කක් වූ බැවිනි. 1781 වන විට කොන්ටිනෙන්ටල් ඩොලරය මුලුමනින් ම සංසරණයෙන් ඉවතට වීසිවන තරමට ඒවා නො වටිනා බවට පත්ව තිබිණි. "කොන්ටිනෙන්ටලයක් තරම්වත් වටින්නේ නෑ" යන්න ද ජනවහරට එක්විය. මහා බ්‍රිතාන්‍යය මෙම යුද්ධයෙන් පැරදුන ද ව්‍යාජ මුදල් හරහා ඇමෙරිකාව ද බිඳ වැටීමට ආසන්න මට්ටමකට ළඟා කළේ ය. ව්‍යාජ මුදලට යම් රටකට හෝ ආර්ථිකයකට කිනම් ආකාරයක බලපෑමක් කළ හැකි ද යන්න මෙයින් පැහැදිලි වේ.

ඩේවිඩ් ෆ්‍රාන්ස්වර්ත් (David Farnsworth) සහ ජෝන් බ්ලෙයාර් (John Blair) මෙම ව්‍යාජ මුදල් මෙහෙයුමට සම්බන්ධවූවන් ලෙස අත්අඩංගුවට ගත් දෙදෙනෙකි. අත්අඩංගුවට පත්වන විට ව්‍යාජ ඩොලර් 10,000 ක් ඔවුන් සන්තකයේ තිබිනි. මෙම නඩුව සම්බන්ධයෙන් ජෝර්ජ් වොෂින්ටන් විශේෂ උනන්දුවක් දැක්වූ අතර ව්‍යාජ මුදල් නිෂ්පාදනය පිළිබඳ වැඩි දුර තොරතුරු ලබා ගැනීම සඳහා ඔවුනට වද දෙන ලෙස නියෝග කළේ ය. අවසන ව්‍යාජ මුදල් නිෂ්පාදනය සම්බන්ධයෙන් වරදකරුවන් වූ ඔවුන් දෙදෙන එල්ලා මරා දමන ලදී.

මෙම පසුබිම තුළ 18 වන සියවසේ සිට ම ඇමෙරිකාව ව්‍යාජ මුදල් වැළැක්වීමෙහි ලා විවිධ පියවර ගෙන ඇති බව




"ව්‍යාජ මුදල් නිපදවන්නන්ට මරණ දඬුවම" යන්න සඳහන් කළ මුදල් නෝට්ටු කිහිපයක්

පැහැදිලි වෙයි. මෙම කටයුත්තට බෙන්ජමින් ෆ්‍රෑන්ක්ලින් ගේ සහයෝගය පතන ලද අතර ඒ අනුව ඔහු විසින් නව මුදල් නෝට්ටු කාණ්ඩයක් මුද්‍රණය කිරීමට පියවර ගත්තේ ය. මෙම මුදල් නෝට්ටු කාණ්ඩයේ බිලැක් බෙරි කොළ තුනක් සහිත අත්තක් හා විලෝ කොළයක් ඇතුළත් නිර්මාණයක් විය. මෙය ඉතා සියුම් රේඛාවලින් යුතු වූ අතර පහසුවෙන් අනුකරණය කළ නො හැකි විය. මෙම නෝට්ටු මුද්‍රණයේ දී "ව්‍යාජ මුදල් නිපදවන්නන්ට මරණ දඬුවම" යන්න ද මුද්‍රණය කිරීමට බෙන්ජමින් ෆ්‍රෑන්ක්ලින් විසින් පියවර ගෙන තිබිණි.

### ඇමෙරිකානු සිවිල් යුද්ධය

ඇමෙරිකානු සිවිල් යුධ සමයේ දී (එ නම්, 1861-1865 කාලයේ දී) එක්සත් ජනපදය ද දකුණු සන්ධාන රජයෙහි මුදල් (Confederate Currency) අනුකරණය කරමින් ව්‍යාජ මුදල් නිපදවා සංසරණයට මුදාහරිමින් මෙම යුද්ධෝපක්‍රමය ම අනුගමනය කළේ ය. ඇමෙරිකානු සිවිල් යුද්ධය ලෙස ඉතිහාසගත ව ඇත්තේ දකුණෙහි ජනපද 11 ක් ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ඉවත් වීමට ගෙන ගිය අරගලය ය. මෙම ජනපද ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ඉවත් ව ඇමෙරිකා රාජ්‍ය සන්ධානයක් ලෙස එක් වූහ. මෙයට මූලික වූයේ ජෙෆර්සන් ඩේවිස් (Jefferson Davis) ය. මෙම ජනපදවල ඒ වන විටත් වහල් ක්‍රමය පැවති අතර කපු වගාව බෙහෙවින් සිදු කෙරුණි. එක්සත් ජනපද ෆෙඩරල් රජයට ඒ වන විටත් වහල් භාවය අහෝසිකර තිබූ ජනපද 20ක ගේත් මායිම් ප්‍රදේශ ලෙස හැඳින් වූ (Border States) ඒ වන විටත් වහල් ක්‍රමය පැවති ජනපද 5කගේත් සහයෝගය ලැබිණි. මෙම ජනපද 25, යුනියනය (Union) ලෙස හැඳින්විනි. මෙම ප්‍රදේශය දකුණු ප්‍රදේශයට වඩා බෙහෙවින් කාර්මීකරණය වූ කලාපයක් විය.

උතුර හා දකුණ අතර හටගත් මෙම අරගලයේ දී දෙපස ම මුදල් මුද්‍රණය කළහ. ඇතැම් මුදල් ඇමෙරිකා සන්ධාන රාජ්‍යය (Confederate State of America) විසින් නිකුත් කරන ලද අතර දකුණේ ම ඇතැම් එක් එක් ජනපද ද යුධ වියදම් සපුරා ගනු වස් තම තමන් විසින් ම මුදල් නෝට්ටු නිෂ්පාදනය කරන ලදී. මෙම පසුබිම ව්‍යාජ මුදල් නිෂ්පාදනය සඳහා මනා පරිසරයක් සකස් කළේ ය. ව්‍යාජ මුදල් නිෂ්පාදනය ඒකාබද්ධ රාජ්‍යවල ස්ථාවරත්වයට විශාල තර්ජනයක් විය. ඒවා ඉතා විශාල වශයෙන් ව්‍යාප්ත ව තිබිණි. සිවිල් යුධ සමයෙහි රාජ්‍ය බැංකු 1600කට වැඩි සංඛ්‍යාවක් තම තමන් ගේ මුදල් නිර්මාණය කිරීම සහ මුද්‍රණය කිරීම සම්බන්ධ ව වගකීම් දැරී ය. එහි ප්‍රතිඵලය වූයේ එකිනෙකට වෙනස් 7,000 ක් පමණ මුදල් වර්ගවල ව්‍යාප්තියයි. මේ නිසා සැබෑ මුදල් සහ ව්‍යාජ මුදල් එකිනෙක වෙන්කොට හඳුනාගැනීම ඉතාමත් ම අපහසු විය. ඇමෙරිකානු සන්ධාන රාජ්‍යය 1861 - 1864 දක්වා මුදල් මුද්‍රණය කර ඇත. නෝට්ටුවලින් වැඩි ප්‍රමාණයක් අතින් අත්සන් කර තිබිණි. මුහුණත වටිනාකම ඩොලර් 1 - 50 දක්වා වටිනාකම්වලින් සමන්විත විය. මෙම අවදියේ සංසරණයේ පැවති මුදල්වලින් 1/3කටත් වඩා වැඩි ප්‍රමාණයක් ව්‍යාජ මුදල් විය.

අවසානයේ 1862 දී එක්සත් ජනපද රජය මෙම ව්‍යාජ මුදල් ප්‍රශ්නය විසඳීමට ජාතික මුදල් ඒකකයක් පිහිටුවිය. නමුත් ව්‍යාජ මුදල් නිපදවන්නෝ ඉතාමත් ම පහසුවෙන් එය ද අනුකරණය කරන්නට පටන් ගත්හ. මේ නිසා ඇමෙරිකානු සිවිල් යුද්ධය අවසන් වූ පසුව 1865 දී එක්සත් ජනපද බුද්ධි අංශය (United States Secret Service) පිහිටුවීමට රජය විසින් පියවර ගන්නා ලදී. ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපති ඒබ්‍රහම් ලින්කන් ව්‍යාජ මුදල් පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා වූ එක්සත් ජනපද බුද්ධි අංශය පිහිටුවීම සඳහා 1865 අප්‍රේල් 14 වන දින අත්සන් තබන ලද නමුදු ඊට පසු දින ම (එ නම් 1865 අප්‍රේල් 15 වැනි දින) ඔහු ඝාතනයට ලක් විය. 1865 ජූලි 5 වන දින එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව යටතේ බුද්ධි අංශය නිල වශයෙන් ආරම්භ විය. ඒ, එහි මූලික පරමාර්ථය ව්‍යාජ මුදල් පිළිබඳ සෙවීම වූ නිසා ය. බුද්ධි අංශය ඉතාමත් උනන්දුවෙන් මෙම කටයුත්තෙහි නියැලුන අතර 1866 දී (එ නම් එය ක්‍රියාත්මක වූ පළමු වසර තුළ ම) එක්සත් ජනපදයේ ක්‍රියාත්මක වූ ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ නිරත වූ 200 ක ගේ කටයුතු අත්හිටුවීමට සමත්වූයේ ය.

ඇමෙරිකානු සිවිල් යුද්ධය අවස්ථාවෙහි ජනපද මට්ටමින් කටයුතු එ සේ සිදුවෙද්දී පෞද්ගලික මට්ටමින් ද යුධ කටයුතුවලට බලපෑම් ඇතිවන ආකාරයේ ව්‍යාජ මුදල් මුද්‍රණ ව්‍යාපෘති සිදුකෙරුණි. සැමුවෙල් අප්හැම් (Samuel Upham) නමැත්තා මෙම කටයුත්තෙහි ලා නිපුණයෙක් වූයේ ය.

### සැමුවෙල් අප්හැම්


සැමුවෙල් අප්හැම්

මොහු ෆිලඩෙල්ෆියාවේ විසූ ව්‍යාපාරිකයෙකි. සිවිල් යුධ සමයෙහි ඖෂධ, සුවඳ විලවුන් සහ ලිපි ද්‍රව්‍ය අලෙවියේ යෙදුනේ ය. සිවිල් යුද්ධයෙහි පළමු වසර තුළ ඇතැම් ව්‍යාපාරිකයන් දේශාභිමානය වඩන දෑ අලෙවියෙන් මුදල් උපයන අයුරු ඔහු දුටුවේ ය. යුද්ධය මුදල් ඉපයීම සඳහා කදිම මඟක් බව දුටු ඔහු දකුණෙහි රාජ්‍ය සන්ධානය අවමානයට ලක් කරමින් යම් යම් දෑ නිපදවා අලෙවි කිරීමෙන් යහමින් මුදල් සෙවිය හැකි බව වටහා ගත්තේ ය. "ජෙෆ් ඩේවිස් ලිපිද්‍රව්‍ය" (Jeff Davis Letter Sheet) ලෙස නම් කරමින් ලිපිද්‍රව්‍ය අලෙවිකිරීම ආරම්භ කළේ ය. අලෙවිය සඳහා සැකසූ ලිපි ලියන කඩදාසිවල බූරුවෙකුගේ රූව යෙදූ ඔහු එම බූරු රූපයෙහි හිස වෙනුවට ජෙෆර්සන් ඩේවිස් ගේ මුහුණෙහි රූව ඊට ආරෝපණය කළේ ය. මෙම කඩදාසි 100ක් ඩොලර් 1කට ද 1000 ක් ඩොලර් 8 කට ද මිල කළේ ය.

ලිපි කවර ද මේ ආකාරයට ම සැලසුම් කොට නිර්මාණය කර ඒවා 100 ක් සත 50 කට ද 1000ක් ඩොලර් 4කට ද මිල කළේ

ය. පසු ව ලිපි කවර සෑදීමේ ව්‍යාපාරය තවත් පුළුල් කරමින් ඒ හරහා දැන්වීම් පළ කළේ ය. නිවේදන නිකුත් කළේ ය. අවසානයේ එම කටයුත්ත ව්‍යාජ මුදල් මුද්‍රණ ව්‍යාපෘතියක් දක්වා ම පුළුල් කළේ ය.

ඔහු ගේ වෙළෙඳසැළෙහි ඉන්ක්වයර් (Inquirer) පුවත්පත අලෙවියට තබා තිබිණි. එක් සඳුදා දිනෙක මෙම පුවත්පත අසාමාන්‍ය ලෙස අලෙවි විය. ඇතැම් ගනුදෙනුකරුවෝ පුවත්පත් දෙක බැගින් මිල දී ගත්හ. අප්හැම් ඔහු ගේ ගනුදෙනුකරුවකුගෙන් එ දින පුවත්පතේ ජනප්‍රියත්වයට හේතු විමසුවේය. එ දින පුවත්පතෙහි දකුණු සන්ධාන රජයෙහි දුඹුරු පැහැති (Grayback) මුදල් නෝට්ටුවෙහි රූපයක් පළ ව ඇති බවත් උතුරු ප්‍රදේශයෙහි ජනපදවල වැසියන් කිසිදු දිනක මෙම නෝට්ටු දැක නැති බැවින් මෙම පුවත් පත මිල දී ගන්නා බවත් ඔහුට දැන ගන්නට ලැබිණි. සැමුවෙල් අප්හැම් පුවත්පතෙහි පළව තිබූ ජනතා කුතුහලයට ලක්වූ මුදල් නෝට්ටුවෙහි රුව පරීක්ෂාකර බැලුවේ ය. එහෙත් දකුණු සන්ධාන රජය විසින් නිකුත්කරන ලද නෝට්ටුවට වඩා ඔහු ගේ සිත් ගත්තේ ඒ හා සමඟ පළවූ වගන්තිය ය. ඒ මෙ සේ ය. "අද පුවත්පතෙහි පළවන මෙම නෝට්ටුවව සැබෑ නෝට්ටුවටත් වඩා අනර්ඝ ය". ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය පිළිබඳ අදහස ඔහුට පහල වී ඇත්තේ එම අවස්ථාවේ ය.

මේ පිළිබඳ සිතා බැලූ ඔහු ඉන්ක්වයර් පුවත්පත් කාර්යාලයට ගොස් නෝට්ටුව පිළිබඳව තතු විමසා බැලුවේ ය. ඒ අනුව එම නෝට්ටුව ඉතාමත් පහසුවෙන් නිෂ්පාදනය කළ හැකි බව වටහා ගත්තේ ය. මන්ද දකුණු සන්ධාන රජයට ඉහළ නිමාවකින් යුත් මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා යෝග්‍ය  තාක්ෂණය නො තිබිණි. අප්හැම් පුවත්පෙතහි පළවූ නෝට්ටුවෙහි සැලසුම්කරු වූ ලී කැටයම්කරු සොයා ගොස් ඔහුගෙන් නෝට්ටුවෙහි මුද්‍රණ තහඩුවක් මිල දී ගත්තේ ය. අනතුරුව එය යොදාගනිමින් මුදල් නෝට්ටු 3000 ක් මුද්‍රණය කළේය. ඒවා උණු කැවුම් මෙන් විකිණිනි. ඇතැමෙක් අප්හැම්ගෙන් ඉතා අඩු මිලකට මිල දී ගත් මෙම මුදල් නෝට්ටු ඊට වඩා වැඩි මිලකට අලෙවි කළහ. ඔහු සිය දෙවන නෝට්ටු මුද්‍රණයේ දී සිය ව්‍යාපාර ප්‍රචාරණය සඳහා එහි පහළ තීරුවක සිය නම, ගම සහ ලිපිනය සමඟින් දැන්වීමක් ද පළකළේ ය. තමන් වෙතින් එම මුදල් තොග සහ සිල්ලර වශයෙන් මිල දී ගත හැකි බව එහි සඳහන් විය.

1862 වසර පුරා ම ඔහු මෙම ව්‍යාජ මුදල් මුද්‍රණ ව්‍යාපෘතිය දිගින් දිගට ම කරගෙන ගිය අතර දකුණු සන්ධාන රජයේ මුදල් නෝට්ටු වර්ග 28ක් ව්‍යාජ ලෙස නිෂ්පාදනය කළේ ය. එහෙත් ඔහු විසින් එක්සත් ජනපද නෝට්ටු ද අනුකරණය කරමින් ව්‍යාජ මුදල් නිපදවන්නේ යැයි එක්සත් ජනපද රජයේ බලධාරීහු සැක කළහ. එහෙත් ඒ පිළිබඳව විමසීමේ දී ඔහු එම චෝදනාව ප්‍රතික්ෂේප කළේ ය. එමතු නොව දකුණු රාජ්‍ය සන්ධානයෙහි මුදල් නිෂ්පාදනය කිරීමෙන් තමන් දකුණෙහි ආර්ථිකය බිඳහෙළීම සඳහා ඒවා කපු මිල දී ගැනීම සඳහා යෙදවීමට ක්‍රියා කළ බවත් කීවේ ය. මේ පිළිබඳව වැඩිදුර විමර්ශනය කිරීම එක්සත් ජනපදයේ යුධ කටයුතු පිළිබඳ ලේකම් එඩ්වින් ස්ටාන්ටන් (Edwin Stanton) හට පැවරුව ද අප්හැම්ට එරෙහි එම චෝදනාව ඔහු විසින් නිෂ්ප්‍රභා කර ඇත. මේ නිසා තවදුරටත් අප්හැම් සිය ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණ ව්‍යාපෘතිය අඛණ්ඩව ම ප්‍රසිද්ධියේ ම කරෙගන ගියේ ය.

මුදල් නෝට්ටු මුද්‍රණය කර ගැනීමට කපු ජාවාරම්කරුවන්ගෙන් විශාල පරිමාණයේ ඇනවුම් ලැබී ඇතැයි වාර්තා වී ඇතත් ඒවායේ වටිනාකම් පිළිබඳව නිශ්චිතව හෙළිදරව් වී නැත. කෙ සේ වෙතත් 1863 වන විට දකුණු සන්ධාන රාජ්‍යයේ බිඳවැටීම ආරම්භවීමත් සමඟ අප්හැම් ගේ ව්‍යාජ මුදල් නිෂ්පාදන සදහා පැවති ඉල්ලුම ද පහළ වැටිනි. ඒ කපු ජාවාරම්කරුවන් අතර දකුණු සන්ධානයෙහි ව්‍යාජ නෝට්ටුවලට මෙන් ම අව්‍යාජ නෝට්ටුවලට ද ගනුදෙනු සඳහා මුදල් ඒකකයක් ලෙස හිමිව තිබූ ස්ථානය එක්සත් ජනපද කොළ පැහැති (Greenback) මුදලට හිමිවීමත් සමඟ ය. ඒ අනුව ඔහු 1863 අගෝස්තුවේ ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය නතර කළේය. එහෙත් ජනරාල් මැක්ලේලන් (General McClellan) හා ඔහු ගේ හමුදාව විසින් ඇමෙරිකා දකුණු සන්ධාන රජයට කරන ලද හානියට වඩා හානියක් තමන් විසින් කළ බව සිවිල් යුද්ධය අවසානයේ අප්හැම් පවසා ඇත.

1861 ජනවාරි - 1865 ජනවාරි දක්වා ල'නර් (Lerner) මිල දර්ශකය අනුව, ඇමෙරිකා දකුණු සන්ධාන රාජ්‍යයෙහි මිල මට්ටම 92 ගුණයකින් ඉහළ නැග ඇති අතර ඊට සාපේක්ෂ ව එම කාල පරිච්ඡේදය තුළ මුදල් සැපයුමේ වැඩිවීම 18 ගුණයක් විය. මිල මට්ටමේ ඉහළයෑමට යුධ, මූල්‍ය හා දේශපාලන ආරංචි කෙරෙහි මහජනතාව දැක්වූ ප්‍රතිචාර හේතු වූ බව ඇතැමකුගේ මතය ය. යුධ පුවත් සමඟ මුදල් පිළිබඳ මහජන විශ්වාසය රැඳි පැවති බව ඔවුහූ අදහස් කරත්. එහෙත් මෙහි දී මුදල් සැපයුම තුළ නිල මුදල් සැපයුම පිළිබඳව පමණක් සළකා ඇති බවත් ප්‍රමාණවත් දත්ත නොමැති හෙයින් ව්‍යාජ මුදල් නිෂ්පාදනය සහ සැපයුම පිළිබඳව නොසළකා හැර ඇති බවත් තවත් ඇතැමෙක් තර්ක කරත්.

යුධ උපක්‍රමයක් ලෙස ව්‍යාජ මුදල් නිපදවීමේ දී බොහෝ විට සිදුකෙරුණේ සතුරු පාර්ශ්වයේ මුදල් නිපදවා ඔවුන්ගේ ආර්ථිකවලට සංසරණය සඳහා ඒවා මුදාහරිමින් එම ආර්ථික බිඳහෙළීමට සැලැස්වීම ය. නො එ සේ නම් සතුරු රටවල නිෂ්පාදන හා නිෂ්පාදන සම්පත් මිල දී ගැනීමට එම මුදල් යෙදවීමයි. එහෙත් ඊට හාත්පසින් ම වෙනස් ආකාරයෙන්, ඇතැම් පුද්ගලයන් සතුරු පාර්ශ්වවල අවශ්‍යතා මත තම රටවලට ම එරෙහිව ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ යෙදෙනු අවස්ථා ද වාර්තා වී ඇත. ඒ පිළිබඳවත් ව්‍යාජ මුදල් නිෂ්පාදන ඉතිහාසයේ වෙනත් සුවිශේෂි අවස්ථා පිළිබඳවත් ඉදිරි ලිපියකින් විමසා බැලේ. ✪

**විශේෂ සටහන:**
පසුගිය කලාපයේ පළ වූ දරිද්‍රතාව හා සම්බන්ධ ලිපිය ලියූ ඩබ්ලියූ. ඒ. දිල්රුක්ෂිනී මහත්මිය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥවරියකි.



# කාසි පුරාණය

**මාලවිකා ආරියරත්න**

සන්නිවේදන දෙපාර්තමේන්තුව

මෙසපොතේමියා නම් පුරාණ ග්‍රීක වචනයෙහි අර්ථය ගංගා අතර යන්න ය. මේ වචනය සෑදීමේ දී සැළකිල්ලට ගත් ගංගා දෙක වූයේ යුප්‍රටීස් සහ ටයිග්‍රීස් ය. එම ගංගා දෙකෙහි ජල කඳ පර්සියානු බොක්කට එක්වීමට පෙර ඒවා වර්තමානයේ අල්-බස්රා (Al-Basra) නමින් හැඳින්වෙන ප්‍රදේශය ආසන්නයේ දී එක් වෙයි. එතැන් සිට පර්සියානු බොක්ක දක්වා ගලන්නේ තනි ගඟකි. වර්තමානයේ දී ඒ ජල කඳ ශට්-අල්-ඇරබ් (Shatt al-Arab) ලෙසින් හැඳින්වෙයි. ලොව මුල් ම ජනාවාස බිහි වූ ප්‍රදේශය ලෙසින් සැළකෙන්නේ ඒ ආශ්‍රිත තෙත්බිම් ය. ඒ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව 4500 පමණ දක්වා දිව යයි. එම ජනාවාස මුල් කරගෙන ලෝකයේ පළමුවන ශිෂ්ටාචාරය ඇති වූයේ ක්‍රිස්තු පූර්ව 3100 දී පමණ ය. මෙසපොතේමියා නමින් ග්‍රීකයෝ හැඳින්වූයේ එම ශිෂ්ටාචාරය යි. සුමේරියානු (Sumer), අකාදියානු (Akkadian), බැබිලෝනියානු (Babylonian) සහ ඇසිරියානු (Assyrian) යන අධිරාජ්‍යය හතර මෙම ශිෂ්ටාචාරය පාලනය කළහ. ඒ අධිරාජ්‍යයන් ගේ බලකණු ලෙසින් බොහෝ නගර ද ගොඩ නැගිණි. සෑම නගරයක් ම නිර්මාණය වූයේ පූජනීය ස්ථානයක් වටා ය. ඒ නගර ඒ ආශ්‍රිත ප්‍රදේශවල ආර්ථික ක්‍රියාකාරකම්වලට පණ දුන්නේ ය. ඒ බැවින් බොහෝ වාණිජ ක්‍රියාකාරකම් එම නගරවල සිදු විය.

මෙසපොතේමියානු ගොවියෝ තමන් ගේ ගොවිබිම්වලට අවශ්‍ය ජලය ලබාගැනීමේ ක්‍රම දැන සිටියහ. ඔවුනට විශාල වශයෙන් බෝග වගා කළ හැකි වූ බැවින් ආහාර හිඟයක් ද නො තිබුණි. භාණ්ඩ සහ සේවා සඳහා හුවමාරු කර ගැනීමට ඔවුහු අතිරික්ත බෝග යොදා ගත්හ. ඒ නිසා ම, පුරාතන මෙසපොතේමියාවේ වෙළෙඳාම ද ඉහළ මට්ටමක පැවතුනි. යුප්‍රටීස් සහ ටයිග්‍රීස් ගංගා නිසා භාණ්ඩ ප්‍රවාහනය පහසු විය. වෙළෙඳාම් ක්‍රමය දියුණු වූයේ මිනිසුන් ගේ අවශ්‍යතා අනුව ය. කඳුකරයේ ජීවත් වූ අයට අවශ්‍ය තිරිඟු සහ බාර්ලි ලබා ගත්තේ ඔවුන් ගේ දැව, හුණුගල්, රත්රන්, රිදී, තඹ වැනි දෑ අනෙක් ප්‍රදේශවල ජීවත් වූ අය සමග හුවමාරු කර ගැනීමෙනි. ගංගා නිම්නවල හණ ගස් බහුල ව වැවුණු නිසා ලිනන් රෙදි ද නිපදවිණි. ලොම් සහ ලොම්වලින් සෑදූ රෙදිපිළි ද වෙළෙඳාමේ දී වැදගත් තැනක් ගත්තේ ය. නැව් සහ ගෘහභාණ්ඩ සඳහා අවශ්‍ය වූ දැව සඳහා ද විශාල ඉල්ලුමක් විය. බාටර් ක්‍රමය මත පදනම් ව මේ සියලු ගනුදෙනු සිදු විය.

ෆිනීසියානුවන් සහ බැබිලෝනියානුවන් අතර ද ක්‍රිස්තු පූර්ව 2500 දී පමණ මෙම වෙළෙඳාම් ප්‍රචලිත විය. බැබිලෝනියානු වැසියෝ ධාන්‍ය, තෙල් සහ රෙදිපිළි වෙනත් රටවල්වලින් ලබා ගත්තේ දැව, වයින්, අගනා ලෝහ සහ වටිනා ගල්වලට හුවමාරුවක් වශයෙනි. සමහර අවස්ථාවල මිනිස් හිස්කබල පවා හුවමාරු භාණ්ඩයක් විය. හුවමාරුව සඳහා භාවිතා කළ තවත් ප්‍රචලිත අංගයක් වූයේ ලුණු ය. එම වකවානුවේ දී ලුණු ඉතා වටිනා ද්‍රව්‍යයකි. කෙතරම් වටිනවා ද යත් ඒ කල රෝම සොල්දාදුවන් ගේ වේතන ගෙවන ලද්දේ ලුණුවලිනි. මෙ ලෙස එම යුගයේ ගෙවීම් කටයුතු බාටර් ක්‍රමයෙන් භාණ්ඩ මුදල් ක්‍රමය වෙත පරිණාමය වෙමින් තිබිණ. මෙම ක්‍රමයේ ප්‍රධාන දුර්වලතාව වූයේ භාණ්ඩ සහ සේවාවල අගය තීරණය කිරීමට ස්ථාවර නිර්ණායකයක් නො තිබීම යි. එම නිසා එකිනෙකා අතර මතභේද සහ ආරවුල් බොහෝ විට ඇති විය. ඒ බැවින්, වෙනත් ගෙවීම් ක්‍රමයක් සොයාගැනීමට සිදුවිය. මුදල් සොයා ගැනීමෙන් එම ප්‍රශ්නය විසඳිණි. එහෙත් බාටර් ක්‍රමය ද භාණ්ඩ මුදල් ක්‍රමය ද විවිධාකාරයෙන් තව දුරටත් ක්‍රියාත්මක විය.

ක්‍රිස්තු පූර්ව 2000 දී පමණ බැබිලෝනියානුවෝ හුවමාරු කිරීමේ මාධ්‍යයක් ලෙස රන් හා රිදී භාවිතා කරමින් ඔවුන් ගේ වාණිජ ගනුදෙනු සිදු කළහ. ඒ සේ වුව ද, පහසුවෙන් සංසරණය කිරීම සඳහා සුදුසු ආකාරයකට මෙම ලෝහ හැඩ ගස්වා නො තිබුණි. එම නිසා ලෝහමය ද්‍රව්‍ය පදනම් වූ මුදල්වල වටිනාකම ගණනය කිරීමට පියවර කීපයක් ගැනීමට සිදු විය. පළමු ව ලෝහයේ ගුණාත්මකභාවය ගණනය කළ යුතු විය. ඒ සඳහා ලෝහය උරගලක ගා පරීක්ෂාවට ලක් කොට එහි වටිනාකම ලබා ගත්තේ ය. පසු ව එහි බර කිරා එය එහි අන්තර්ගත ලෝහ වටිනාකමින් ගුණ කරන ලදී. සමහර අවස්ථාවල රන් හා ඊයම් මිශ්‍ර ලෝහ ද හුවමාරු වුණි. එම අවස්ථාවල දී රත්රන්වල බර ප්‍රමාණය පමණක් ලබා ගැනීම සඳහා ලෝහයේ බර එහි ඇති රත්රන් ප්‍රතිශතයෙන් ගුණ

කිරීමට ද සිදු විය. සෑම ගනුදෙනුවක දී ම ලෝහයේ බර සහ නුමුහුම් බව පරීක්ෂාවට ලක් වූයේ මෙම මුදල් ඒකක ප්‍රමිතියෙන් තොර වූ නිසාවෙනි. එම නිසා යම් වස්තුවක් සත්‍ය කාසියක් වීමට නම් නිර්ණායක තුනක් අවශ්‍යයෙන් ම තිබිය යුතු බවට පිළිගැනීමක් ඇති විය. එම නිර්ණායක නම්,

1. එය වටිනා ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතු වීම සහ ද්‍රව්‍යයේ සත්‍ය අගයට ආසන්න අගයකින් ගනුදෙනු කළ යුතු වීම
2. එයට සම්මත බරක් තිබිය යුතු අතර නුමුහුම් වීම
3. එහි අඩංගු දෑ පිළිබඳ ව වග කියනු ලබන බලධරයා කවුරු දැ යි හඳුනා ගැනීම පිණිස එහි ඒ පිළිබඳ සටහනක් තැබිය යුතු වීම



මේ නිර්ණායක මත පදනම් ව, ක්‍රිස්තු පූර්ව 620 සිට 600 දක්වා කාලය තුළ දී බටහිර ආසියාවේ ඇනටෝලියානු අර්ධද්වීපයේ පිහිටි ලිඩියාවේ (Lydia) වැසියෝ කනකරජත (Electrum) නම් රන් හා රිදීවලින් සෑදුණු ස්වභාවික ලෝහයක් මුදල් ලෙසින් හැඩ ගැස්වීමට පටන් ගත්හ. ඒ, කාසි ටංකනයේ ආරම්භයයි. එය බෝංචි ඇටයක හැඩය ගත්තේ ය. එයට නියමිත බරක් විය. එය වෙනත් ලෝහ වර්ග සමග මුහු කළේ නැත. එ ලෙස ම රාජ්‍ය සංකේත භාවිතා කරමින් ඒවාට මුද්‍රා තැබී ය. මෙම පුරාණ කාසි ඉතා ඉක්මනින් ප්‍රසිද්ධියට පත් විය. එයට හේතුව වූයේ වෙළෙඳාමේ දී ඒවා භාවිතය පහසු වීමයි. ක්‍රිස්තු පූර්ව 550 වන විට මෙම කාසි ලෝකයේ සියලු ම ප්‍රාථමික වෙළෙඳ නගරවල භාවිතා විය.



ක්‍රිස්තු පූර්ව 595 දී ඒජයිනාවේ (Aegina) ද ක්‍රිස්තු පූර්ව 575 දී ඇතැන්ස්වල ද ක්‍රිස්තු පූර්ව 570 දී කොරින්තෝවේ (Corinth) ද ග්‍රීක ජාතිකයෝ තමන් ගේ ම කාසි නිෂ්පාදනය කිරීමට පටන් ගත්හ. එම කාලයේ දී ම ග්‍රීසියේ පාලකයකු වූ පේසිස්ට්‍රාටස් (Peisistratus) විසින් අවුල්ස් (Owls) නම් කාසි වර්ගය ප්‍රථමයෙන් ම නිෂ්පාදනය කළේ ය.



ඒ සඳහා රිදී ලබා ගත්තේ ඇතැන්ස් නුවර ආසන්නයේ පිහිටි ලෝරියන් (Laurion) පතලිනි. ක්‍රිස්තු පූර්ව 407 දී ස්පාටාවරු මෙම පතල අල්ලා ගත් අතර ඇතැන්ස් නුවරට රිදී සැපයුම ඔවුන් විසින් අත් හිටුවන ලදී. මේ නිසා ඇතැන්ස් නුවර වැසියෝ තමන් අතට පත් වූ රිදී කාසි සඟවා ගත්හ. එහි ප්‍රතිපලයක් වශයෙන් රිදී කාසි සංසරණයෙන් ඉවත් විය. ඒ වෙනුවට රිදී ආලේපයක් සහිත ලෝකඩ කාසි සංසරණයට එක් විය. මේ අතර රෝමන්වරු රෝමයේ කාසි නිෂ්පාදකයින් වෙසෙන ප්‍රදේශයේ ඔවුන් ගේ අනතුරු ඇඟවීමේ දෙවඟන වන මොනෙටා (Moneta) සඳහා පූජ්‍යස්ථානයක් සෑදූහ. මේ නිසා Money සහ Mint යන වචන Moneta යන වචනයෙන් උපත ලැබූ බවට විශ්වාස කරනු ලබයි.

කාසි නිෂ්පාදනය පිළිබඳ දැනුම පර්සියාවට ලැබීම පිළිබඳ ව ද රසවත් කතාවක් වෙයි. එයට මුල් වූයේ ක්‍රිස්තු පූර්ව 547 දී, ලිඩියානු රජ ක්‍රොයේසස් (Croesus) විසින් කැපඩොසියාවේ (Cappadocia) පිහිටි පර්සියානු නගරයක් අල්ලා ගෙන එහි ජනයා වහල්කමට ගැනීමේ කාරණය යි. මෙම ආක්‍රමණය ගැන ඇසූ පර්සියාවේ මහා සයිරස් (Cyrus the Great) රජු හමුදා රැගෙන ගොස් ලිඩියානු හමුදාවලට පහර දුන්නේය. එම යුද්ධයෙන් කිසිදු පාර්ශ්වයකට පැහැදිලි ජයක් අත් නො වුන ද ලිඩියානුවෝ පසුබැසීමට තීරණය කළහ. මාස කිහිපයක් ගත වූ තැන ලිඩියානු අගනුවරට පහරදුන් සයිරස් රජු ක්‍රොයේසස් ගේ පාලනය අවසන් කර දැම්මේ ය. මේ ගැටුම්වල වක්‍ර ප්‍රතිඵලය වූයේ කාසි නිෂ්පාදනය පිළිබඳ දැනුම පර්සියාවට හිමි වීම ය. කෙ සේ වෙතත්, ග්‍රීක වැසියන් මෙන් නො ව පර්සියානු වැසියෝ රිදී කාසිවලට වඩා රන් කාසිවලට වැඩි කැමැත්තක් දැක්වූහ.



මහා ඇලෙක්සැන්ඩර් රජු ගේ පියා (එ නම්, දෙ වැනි පිලිප් රජු) ප්‍රමාණය ඉක්මවා කාසි නිෂ්පාදනය කළේ ය. ඒ අතර ස්ටේටර් (Stater) නම් රන් කාසිය ද විය. එය ක්‍රිස්තු පූර්ව 356 දී පැවැති ඔලිම්පික් තරගාවලියට ඇතුළත් වූ රිය තරගයෙන් ඔහු ලැබූ ජයග්‍රහණය සනිටුහන් කිරීමට නිම වන ලද්දකි. මධ්‍යම සහ උතුරු යුරෝපයේ මෙම ස්ටේටර් කාසි බෙහෙවින් සංසරණය විය.

මේ අතරතුර, චීනයේ ශිල්පීහු ද වෙනස් ක්‍රමයකට කාසි නිර්මාණය අරඹා තිබුණි. ඒ අච්චු තුළට රත් කරන ලද ලෝකඩ වත් කිරීමෙනි. එ බැවින්, එහි ප්‍රතිඵලය ද වෙනස් ස්වරූපයක් ගත්තේ ය. පුද පූජා සඳහා අවශ්‍ය එක් එක් හැඩයේ විසිතුරු බඳුන් සෑදීමට හුරු පුරුදු චීන ලෝකඩ ශිල්පීහු සරල රවුම් කාසියට වඩා සංකීර්ණ දෙයක් කිරීමට යොමු වූහ. මුල් ම චීන කාසිවල විශේෂ ලක්ෂණය වූයේ හැඩ දෙකකින් යුක්ත වීමයි. එක් හැඩයක් පොළොව හෑරීමට ගන්නා සවලක ලෝහ කොටසට සමාන විය. අනෙක මිටක් සහිත පිහි තලයක හැඩය ගත්තේ ය. මෙම දෙ වර්ගයේ ම මතුපිට චීන අකුරුවලින් සරසා තිබුණි. චෝ (Zhou) අධිරාජ්‍යයේ (ක්‍රිස්තු



පූර්ව 1122 – ක්‍රිස්තු පූර්ව 256) අවසාන ශත වර්ෂ කිහිපයේ දී චීනයේ සෑම පළාතක ම පාහේ මෙම කාසි භාවිතා කරන ලදී. ක්‍රිස්තු පූර්ව 3 වන ශත වර්ෂය අග භාගයේ දී චීනයේ පළමු අධිරාජ්‍යයා රවුම් කාසියක් හඳුන්වා දුන්නේ ය. නො තලා, ලෝකඩවලින් වාත්තු කළ මෙම කාසියේ මධ්‍යයේ හතරැස් හැඩැති සිදුරක් ද විය.

ක්‍රිස්තු පූර්ව 55 දී පමණ ජුලියස් සීසර් විසින් බ්‍රිතාන්‍ය ආක්‍රමණය කරන විට එහි මුදල් ලෙස භාවිතාවට ගැනුනේ කඩු පත් ය. මෙය ජුලියස් සීසර් ගේ අවඥාවට ද ලක් විය.

කනකරජත භාවිතය කාසි ටංකනය දියුණුවීමත් සමග ම අවසන් විය. කනකරජත යනු ශුද්ධ නො කළ මිශ්‍ර ලෝහයකි. එ බැවින්, ඒ භාවිතයෙන් සෑදූ කාසිවල රන් සහ රිදී අනුපාතය එකින් එකට වෙනස් ව පැවැතිනි. මේ නිසා කාසි ටංකනය කරන්නෝ රන් සහ රිදී වෙන් කොට කාසි නිර්මාණය කිරීමට තීරණය කළහ. ඒ අනුව, ඔවුහු රන් සහ රිදී කාසි වෙන් වෙන් ව ටංකනය කළහ. එ මෙන් ම, ඔවුහු රන් සහ රිදී නියමිත අනුපාතයකට මිශ්‍රකර කාසි ටංකනය ද ආරම්භ කළහ.

ශත වර්ෂ ගණනාවක සිට කාසිවල අලංකාරය සහ විවිධත්වය සැළකිය යුතු ලෙස වෙනස් විය. මුල් ම කාසිවල රළු මෝස්තරයක් එක් පැත්තක විය. අනෙක් පැත්තෙහි බොහෝ විට වූයේ මිටියකින් තලන ලද සළකුණකි. සියවස් කීපයක් තුළ, උසස් කලාත්මක බවකින් යුතු කාසි පළමු ව ග්‍රීසියේත් පසු ව රෝමයේත් දැක ගත හැකි විය. තුන් වැනි සහ හතර වැනි ශත වර්ෂවල රෝම අධිරාජ්‍යය පසුබැසීමත් සමග ම රෝම කාසි ද පිරිහීමට ලක් විය. මේ ආකාරයේ දියුණුවීම්, පිරිහීම් මධ්‍යයේ කාසි ටංකනය ලොව සෑම ප්‍රදේශයක ම විවිධාකාරයෙන් පරිණාමය වන්නට විය. සියවස් ගණනාවක් ම ගෙවී ගියේ ය. 15 වන ශත වර්ෂය වන විට, යුරෝපය විශිෂ්ට නිමාවෙන් සහ කලාත්මක මෝස්තරවලින් යුතු අලංකාර කාසි නිෂ්පාදනය කිරීමට පටන් ගත්තේ ය.

### කාසි ටංකනය කරනු ලබන ලෝහ

ලෝහවලින් කාසි සෑදීමට බල පෑ වැදගත් හේතු ගණනාවක් ම පැරැන්නන්ට විය.

- ලෝහ වටිනාකමින් ඉහළ ය. ඉහළ වටිනාකමකින් යුතු කාසි සාදනු ලබන්නේ ඉහළ වටිනාකමකින් යුතු ලෝහවලිනි.
- ලෝහ කල් පවත්නා ද්‍රව්‍යයකි. පාෂාණ මෙන් නො ව, ලෝහ විනාශ වන්නේ නැත. දැව මෙන් පහසුවෙන් දැවී යන්නේ ද නැත. කඩා දැමීමට ද අපහසු ය.
- ලෝහ හැඩගැන්වීමට සහ මුද්‍රා තැබීමට පහසු ය. ලාභ ය. ඒවා උණු කර නැවත වාත්තු කළ හැක. ඒවා ඕනෑ ම සංකේතයකින් මුද්‍රා තැබිය හැක. මුද්‍රා තැබූ විට සත්‍ය ව්‍යවහාර මුදල් හා ව්‍යාජ මුදල් පහසුවෙන් වෙන් කොට හඳුනා ගත හැකි ය.

වර්තමානයේ දී කාසිවලින් ක්‍රියා කරන විකිණුම් යන්ත්‍ර (Vending Machines) ද වෙයි. ඒවා සඳහා ද ලෝහ කාසි අවශ්‍ය වේ. කාසිවල ඇති විද්‍යුත් චුම්භක ලක්ෂණවලින් එම යන්ත්‍රවලට සත්‍ය මුදල් හඳුනාගත හැකි ය. ව්‍යාජ මුදල් ප්‍රතික්ෂේප කළ හැකි ය. වර්තමානයේ බොහෝ කාසි සාදා ඇත්තේ කියුප්‍රෝ-නිකල් (තඹ 80% ක් හා නිකල් 20% පමණ, රිදී පැහැයෙන්), නිකල්-පිත්තල (තඹ 75% ක්, නිකල් 5% ක් හා තුත්තනාගම් 20% ක්, රන් පැහැයෙන්), මැංගනීස්- පිත්තල (තඹ, තුත්තනාගම්, මැංගනීස් සහ නිකල්), ලෝකඩ හෝ ආලේපිත වානේවලිනි.



### කාසි ටංකනයේ ශිල්ප ක්‍රම

කාසි ටංකනය ඕනෑ ම අයකුට කළ හැකි කාර්යයක් නො වේ. ඒ සඳහා නීතිමය බලයක් තිබිය යුතු ය. රටක පාලනාධිකාරිය විසින් හෝ අධිකාරය පැවරුනු ආයතන විසින් හෝ පමණක් කාසි ටංකනය කරනු ලැබේ.


ආරම්භයේ සිට ම, කාසි ටංකනයේ ශිල්ප ක්‍රම ප්‍රධාන අංග දෙකකින් යුක්ත විය. එහි පළමුවැන්න වූයේ නිශ්චිත සංයුතියකින් සහ නිවැරදි බරින් යුතු කාසියට උචිත කුඩා ලෝහ කවයක් (එ නම්, හිස් කාසියක්) නිපදවීම යි. ටංකනය සඳහා අවශ්‍ය මෙවලම් නිර්මාණය දෙවනුවට විය.

### මිටියකින් පහර දී කාසි ටංකනය

මුල් ම ටංකන ශිල්ප ක්‍රමවල සිට මේ දක්වා ඇති ශිල්ප ක්‍රමවල ප්‍රධාන වශයෙන් වෙනසක් දැක ගත නො හැක. කාර්මිකකරණය සහ තාක්ෂණික දියුණුව හේතුවෙන් මේ සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවල වැඩි දියුණුවීමක් පමණක් දැක

ගත හැක. මුල් ම අවධියේ සිට පවා, මුද්‍රා දෙකක් භාවිතා කොට කාසි ටංකනය කරන ලදී. ඒවා නම් කාසිය විස්තර ඇතුළත් පහළ මුද්‍රාව සහ ඒ හා සමාන ඉහළ මුද්‍රාවයි. මෙම මුද්‍රා දෙක අතර හිස් කාසිය තබා ඉතා බර මිටියකින් ඉහළ මුද්‍රාවට පහර දෙනු ලබයි.

කාසියේ රූපයක් ඔබ්බවනු ලබන්නේ ඒ ලෙසට ය. මධ්‍යතන යුගය දක්වා ම කාසි ටංකනය සඳහා මෙ ලෙස මිටියකින් පහර දීමේ ක්‍රමය පැවතුණි. අද ද මෙම ක්‍රමය පිළිබඳ ව අසන්නට ලැබේ. එහෙත්, ඒ නිරන්තරයෙන් ම නො වේ.


කාසි ටංකනයට යොදාගත් ස්කුරුප්පු පීඩකයක්

ඉහතින් කී ආකාරයට මුලින් ම කාසි ටංකනය කළේ ක්‍රිස්තු පූර්ව 7 වන සියවසේ දී ලිඩියානුවන් විසිනි. මේවා නිර්මාණය කරන ලද්දේ රන් හා රිදී සංයුතියකින් යුතු මිශ්‍ර ලෝහයක් වන කනකරජතවලින් සෑදූ හිස් කාසිවලිනි. මුලින් ම කනකරජත උණු කොට ද්‍රව තත්ත්වයට පත් කළේ ය. ඉන්පසු ව ඒවා අච්චුවලට වත් කරන ලදී. මේ සඳහා පළමු ව භාවිතා කළේ සරල අච්චු ය. පසු කාලයක දී එය ඉතා සංකීර්ණ අච්චු දක්වා වර්ධනය කෙරිණි. එ පමණක් නො ව එක් වරකට නිෂ්පාදනය කරනු ලබන කාසි සංඛ්‍යාව ද ඉතා ඉහළ ගියේ ය. අනෙක් රටවල් ද කාසි භාවිතයට ශීඝ්‍රයෙන් පුරුදු විය. ක්‍රමයෙන් යුරෝපය, ආසියාව සහ අප්‍රිකාව පුරා ම කාසි සුලබ ව දැකිය හැකි විය. ශත වර්ෂ ගණනාවක් තිස්සේ මෙම ක්‍රමයට කාසි ටංකනය නො වෙනස් ව පැවතිණ.


ලෝහ තහඩුවල ඝනකම අඩු කිරීම සඳහා මිටියක් භාවිතා කළේ ය. හිස් කාසි කපා ගන්නා ලද්දේ විශාල කතුරකිනි. පසු ව ඒවා පීරි ගා මිටියකින් පහර දී අපේක්ෂිත තරම සහ ඝනකම ලබා ගත්තේ ය. නියමිත මුද්‍රාවක් මත මෙම හිස් කාසි තබන කාර්මික ශිල්පියා ඊට ඉහළින් ඇති එහා මෙහා කළ හැකි මුද්‍රාව මතට මිටියකින් කිහිප වරක් පහර දී කාසි ටංකනය කළේ ය.

කාසි ටංකනයේ මෙම ක්‍රමය ශ්‍රමය වැඩියෙන් වැයවන, අකාර්යක්ෂම, මිල අධික එකකි. මෙයට වඩා ඵලදායී ක්‍රමයක් සොයා ගැනීමට කාසි ටංකනය කරන්නෝ වෙහෙසුණහ. නොයෙක් හේතු නිසා එයට වසර දහස් ගණනක් ම ගත විය.

කාසි සඳහා වන ඉල්ලුම රඳා පවතින්නේ එම කාසි සංසරණය වන ආර්ථිකයේ විශාලත්වය මත ය. මුල දී, ග්‍රීක සහ රෝම වැසියන් ගේ ආර්ථික ක්‍රියාකාරකම් සීමිත ප්‍රදේශයකට පමණක් සීමා විය. රෝම අධිරාජ්‍යය විශාල ප්‍රදේශයකට පැතිරී ගියත්, එය කුඩා ආර්ථිකවල එකතුවක් විය. එම කුඩා ආර්ථිකවලට කාසි සපයනු ලැබුවේ ප්‍රාදේශීය කාසි ටංකනය කරන්නන් විසිනි. රෝමය ඔවුන්ට ඒ සඳහා අවසරය ලබා දුනි. තමන් ගේ ප්‍රදේශයට අයත් කාසි ටංකනය ඔවුන ගේ වගකීම විය. එම නිසා තම ප්‍රදේශයට අවශ්‍ය වන සීමිත කාසි ප්‍රමාණය නිෂ්පාදනය කිරීමට ඔවුනට හැකියාවක් තිබිණි. තවත් හේතුවක් වූයේ ඉතා සෙමින් වර්ධනය වන හෝ වර්ධනය නො වන ආර්ථිකයන් පැවතීමයි. මධ්‍යකාලීන යුගයේ දී බ්‍රිතාන්‍ය රිදී පැන්සය අවුරුදු 500 ක කාලයක් පුරා ම නො වෙනස් ව පැවතීම මෙයට උදාහරණයකි. මෙ වැනි ආර්ථික තත්ත්වයක දී තාක්ෂණික පර්යේෂණවලට සහ වැඩි දියුණු කිරීම්වලට අනුබලයක් නො ලැබෙයි. එම නිසා මෙ වැනි කාලවල දී කාසි සඳහා වන ඉල්ලුම සපුරාලීමට මිටියකින් පහර දී කාසි ටංකනය කිරීමේ ක්‍රමය ප්‍රමාණවත් විය.

## යාන්ත්‍රික මිටියක්!


ආසියාව සමග යුරෝපය කරන ලද වෙළෙඳ ගනුදෙනු ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන්නට විය. ඒ හේතුවෙන් යුරෝපයේ සිටි කාසි ටංකනකරුවෝ ශ්‍රමය සහ කාලය අඩුවෙන් වැය කොට කාසි නිෂ්පාදනය කිරීම සඳහා ඉස්කුරුප්පු පීඩකය (Screw Press) වැනි වඩාත් කාර්යක්ෂම යන්ත්‍ර නිර්මාණය කළහ.


මුල් යුගයේ දී හිස් කාසි කැපීමට යොදාගත් යන්ත්‍රයක්

ක්‍රිස්තු වර්ෂ 1500 දී ලියනාඩෝ ඩා වින්චි ඔහු ගේ සටහන් පොත්වල කාසි, පදක්කම් සහ මුද්‍රා සෑදීම සඳහා භාවිතයට ගත හැකි, ජලයෙන් ක්‍රියා කරන යන්ත්‍රයක රූපයක් ඇඳ දැක්වූයේ ය. ඔහු මෙහි දී පීඩක දෙකක් යොදා ගත්තේ ය. එක් පීඩකයකින් හිස් කාසි සෑදූ අතර අනෙක් පීඩකයෙන් සංකේත හෝ අක්ෂර නිර්මාණය කළේ ය. මේ ක්‍රියා දෙක ම සිදු වූයේ එක ම පහරකිනි. එ සේ වුව ද, ඩා වින්චි ගේ පීඩකය කිසි දා සැබෑවක් වූවක් නො වේ. ඩා වින්චි ගේ චිත්‍රනය උපයෝගී කොට ගෙන 20 වන ශත වර්ෂයේ දී IBM සමාගම පීඩකයක් නිෂ්පාදනය කළේ ය. එහෙත් එය ද හුදු ප්‍රදර්ශන භාණ්ඩයක්ම පමණකි. එය

දැනට ලෝකයේ විශාල ම කෞතුකාගාරය සහ පර්යේෂණ සංකීර්ණය වන එක්සත් ජනපදයේ වොෂින්ටන් නුවර පිහිටි ස්මිත්සෝනියන් (Smithsonian) ආයතනයේ තබා තිබේ.

නූතන යුගයේ මුල් කාලයේ දී කාසි නිෂ්පාදන ක්‍රමවල විශාල වෙනසක් දැක ගත හැකි විය. 1506 දී ඉතාලි ජාතික ඩොනටෝ (Donato) ප්‍රථම වරට ඉස්කුරුප්පු පීඩකය නිර්මාණය කළේ ය. නමුත් එයින් නිෂ්පාදනය කළ හැකි වූයේ හිස් කාසි පමණි. 1550 වසරේ දී පමණ, ජර්මන් ජාතික රිදීකරුවකු වන මැක්ස් (Max) ඉස්කුරුප්පු පීඩකය භාවිතයෙන් කාසි නිෂ්පාදනය කිරීම හඳුන්වා දුන්නේ ය. මෙම පීඩකයෙන් හිස් කාසි සෑදීම සහ මුද්‍රා තැබීම යන කාර්යයන් දෙක ම එකවර කළ හැකි විය. එ සේ ම හිස් කාසි සෑදීම සඳහා ලෝහ තීරු එහා මෙහා ගෙන යෑමට අවශ්‍ය උපකරණ ද එයට ඇතුළත් කර තිබිණි. මෙම තීරුවලින් හිස් කාසි කපන ලද්දේ ලෝහ කටුවකිනි. මෙම යන්ත්‍රය අතිශයින් ඵලදායී විය. උසස් තත්ත්වයෙන් යුතු කාසි නිෂ්පාදනය කිරීමට එය රුකුලක් වූවා සේ ම මිනිත්තුවකට කාසි 30 සිට 60 දක්වා ප්‍රමාණයක් නිෂ්පාදනයට ද එය සමත් විය.



ලෝහ තීරුවලින් හිස් කාසි කපන ලීවර පීඩක යන්ත්‍රයක්

මෙයට සමාන සිදුවීමක් බ්‍රිතාන්‍යයේ ද සිදු විය. එ වකට බ්‍රිතාන්‍යයේ රජ කළ දෙ වන හෙන්රි රජු මෙම පීඩකයක් මිල දී ගත්ත ද එය භාවිතයට කාසි නිෂ්පාදකයෝ මැලි වූහ. එම නිෂ්පාදකයන්ට දැඩි දඬුවම් පමුණුවා ඔවුන් ව මර්දනය කිරීම රජු ගේ ප්‍රතිචාරය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1652 දී රෝයල් මින්ට් (Royal Mint) සමාගම මෙම ඉස්කුරුප්පු පීඩකය භාවිතය ආරම්භ කළේ ය. එම වසරේ දී ම ඇමෙරිකානු යටත් විජිත ද ප්‍රථම වරට මෙම පීඩකය යොදා ගනිමින් කාසි ටංකනය ඇරඹුවේ ය.


කාසි සෑදීමේ ක්‍රමයේ විශාල වෙනසක් ඇති කළේ ජර්මන් ජාතිකයකු වූ ඩයිඩ්රිච් (Diedrich) නම් යාන්ත්‍රික ශිල්පියා ය. ඔහු 1812 දී වෙනත් ආකාරයක පීඩකයක් නිර්මාණය කළේ ය. ඩයිඩ්රිච් මෙම නව නිර්මාණය සඳහා පේටන්ට් බලපත්‍රයක් ද ලබා ගත්තේ ය. ජර්මනියේ සිටි කාසි නිෂ්පාදකයින්ට මෙම පීඩක අලෙවි කිරීම පිණිස පීඩක සෑදීම සඳහා කර්මාන්තශාලාවක් ද ආරම්භ කළේ ය. ඔහු ගේ සොයා ගැනීම ඔහු හැඳින්වූයේ ලීවර පීඩකය (Lever Press) නමිනි. 1847 වන විට කාසි ටංකනය කළ සමාගම් නවයකට එ වැනි පීඩක 57 ක් අලෙවි කිරීමට ඩයිඩ්රිච් සමත් විය. ආරම්භයේ දී මෙම පීඩකය වාෂ්ප බලයෙන් ක්‍රියා කළ ද පසු කලෙක දී එය ක්‍රියා කරවනු ලැබුවේ විදුලි බලයෙනි. මෙය ඉස්කුරුප්පු පීඩකයට වඩා බොහෝ කාර්යක්ෂම විය. එය ලීවර පද්ධතියකට සම්බන්ධ වූ බරැති රෝදයක උපකාරයෙන් ක්‍රියාත්මක වූවකි. එහි දී ඉහළින් වූ කාසි මුද්‍රාව හිස් කාසිය දක්වා ම ගමන් කළේ ය.

මෙම පීඩකයේ ඉහළින් පිටතට විහිදී ගිය බාහු දෙකක් වෙයි. මධ්‍යයේ සිරස් සිලින්ඩරයකට යා කොට ඇති මෙම බාහු දෙකෙහි කෙළවරට විශාල බරක් සම්බන්ධිත ය. බොහෝ විට ඒ සඳහා යකඩ බෝල යොදා ගැනිණි. කාසි සාදන්නන් පීඩකයේ බර තැබූ බාහු වෘත්තාකාර චලනයකින් කරකවන විට සිලින්ඩරය සෑළකිය යුතු බලයකින් පහළට ගමන් කරයි. එ විට සිලින්ඩරයේ කෙළවර සහ පහළ ඇති මුද්‍රාවල ඇති අක්ෂර සහ සංකේත අලුතින් සාදනු ලබන කාසියේ දෙ පැත්තට කා වදියි.

යන්ත්‍රයක් වුව ද මෙයට මිනිස් ශ්‍රමය ද නො මඳ ව යෙදිය යුතු විය. කාසි නිෂ්පාදනය කිරීම සඳහා කීප දෙනකු ම කණ්ඩායම් වශයෙන් විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. අවම වශයෙන් එක් කණ්ඩායමකට මිනිසුන් 8 දෙනකු යෙදවිණි. විනාඩි 15 කට වරක් ඒ කණ්ඩායමට විවේක දීමට ද සිදුවිය. ඒ නිසා විකල්ප කණ්ඩායම් ද සූදානමින් තබා ගත යුතු විය.

මැක්ස් විසින් මෙම පීඩකය ඉතාලියේ සහ ජර්මනියේ කාසි ටංකනය කරන්නන්ට විකිණීමට උත්සාහ දැරුව ද එය කළ නො හැකි විය. කෙ සේ වෙතත් ප්‍රංශ ජාතිකයෙක් මෙය මිල දී ගත්තේ ය. එහෙත් ප්‍රංශයේ සිටි මිටියෙන් පහර දී කාසි ටංකනය කරන්නෝ මේ නව ක්‍රමය භාවිතා කිරීමට එරෙහි වූහ. අවසානයේ දී 1641 වසරේ දී පැරිස් මින්ට් (Paris Mint) සමාගම මැක්ස් ගේ මෙම පීඩකය භාවිතයට ගෙන කාසි ටංකනය කළේ ය.

1833 දී පැරිසියේ සිටි යාන්ත්‍රික ශිල්පියකු වූ තොනෙලියර් (Thonnelier) නමැත්තා ඩයිඩ්රිච් ගේ තාක්ෂණයට සමාන වූ තවත් පීඩකයක් හඳුන්වා දුන්නේ ය. එ සේ වුව ද ඔහු මෙම පීඩක නිෂ්පාදනය කිරීමෙන් වැළකී සිටියේ ය. ඒ වෙනුවට එම ශෛලියේ පීඩක නිර්මාණය කිරීමට අවශ්‍ය සැලැසුම් චිත්‍රනය කොට අලෙවි කිරීම පමණක් ඔහු සිදු කළේය. 1833 දී යුනයිටඩ් ස්ටේට්ස් මින්ට් (U.S.Mint) සමාගම තොනෙලියර් ගේ සැලසුමක් මිල දී ගත්තේ ය. ඒ ආශ්‍රයෙන් පළමු වන පීඩකය නිෂ්පාදනය කළේ මෙරික් (Merrick), ඇග්නෙව් (Agnew) සහ ටයිලර් (Tyler) යන තිදෙනා ය. 1840 දී ෆ්‍රෑන්ක්ලින් (Franklin) නම් අයකු එය තව දුරටත් වැඩි දියුණු කළේ ය. ඩේවිඩ් ගිල්බර්ට් (David Gilbert) නමැති (යුනයිටඩ් ස්ටේට්ස් මින්ට්) සමාගමේ සේවය කළ ඉංජිනේරුවරයෙක් 1858 දී තෝනෙලියර් පීඩකයේ බලය තවත් වැඩි කරමින් එය ප්‍රතිනිර්මාණය කළේ ය.




**ටංකිත කාසිවල තත්ත්ව පරීක්ෂාවේ යෙදෙමින්**

මුල සිට ම තම යන්ත්‍රය මිල දී ගන්නා ලෙස තොනෙලියර් ප්‍රංශයේ පැරිස් මින්ට් සමාගමෙන් අයැද සිටියේ ය. එහෙත් පැරිස් මින්ට් සමාගම ඒ පිළිබඳ ව සැළකිල්ලක් දැක්වූයේ නැත. මේ අතරතුර දී කයිලි (Caili) නමැත්තෙක් 1840 දී තොනෙලියර් ගේ සැලසුමක් මිල දී ගෙන පීඩකයක් නිර්මාණය කළේ ය. කයිලි ගේ මෙම පීඩකය පැරිස් මින්ට් සමාගමට රැගෙන ගොස් එහි සවි කිරීමට තොනෙලියර් ක්‍රියා කළේ ය. මින්ට් සමාගම පීඩකය මිල දී ගනු ඇති බවට ඔහු ගේ බලාපොරොත්තුවක් විය. නමුත් සමාගම එය මිල දී ගත්තේ එයට වසර පහකට පසු, එ නම් 1845 වසරේ දී ය. සමාගම විසින් පීඩකයේ කාර්යක්ෂම බව සැළකිල්ලට ගෙන එය මිල දී ගැනීමට නිර්දේශ කරමින් 1843 වසරේ දී එවකට ප්‍රංශයේ සිටි මුදල් ඇමතිට ලිපියක් යොමු කළේ ය. එහි සඳහන් වූයේ පැරැණි ඉස්කුරුප්පු පීඩකයට වඩා දෙ ගුණයක් වේගයෙන් තොනෙලියර් පීඩකය කාසි නිපදවන බවත් ඒ සඳහා සියයට 150 ක් අඩුවෙන් ශ්‍රමය යෙදවිය හැකි බවත් ය. එහෙත් මුදල් ඇමතිට එය ඒත්තු ගැන්වීමට බෙහෙවින් අසීරු විය. එ බැවින් ඒ සඳහා කමිටුවක් පත් කෙරිණි. 1844 දී කමිටුව විසින් ඉහත සඳහන් කරුණු සත්‍ය බව තහවුරු කරන තෙක් සමාගමට පීඩකය මිල දී ගත නො හැකි විය.

එම පීඩකය තොනෙලියර් විසින් සැලසුම් කළ ද කිසිදිනෙක එය හැඳින්වීම සඳහා ඔහු ගේ නම යොදා ගැනුනේ නැත. එම පීඩක හැඳින්වූයේ ඔහුගේ සැලසුම් ආශ්‍රයෙන් පීඩක නිෂ්පාදනය කළ අන්‍ය පුද්ගලයින් ගේ නම්වලිනි. දෙවන ජාත්‍යන්තර කාර්මික ප්‍රදර්ශනය පවත්වනු ලැබුවේ 1862 දී ලන්ඩන් නගරයේ දී ය. එයට කාසි ටංකන පීඩක නිෂ්පාදක පාර්ශ්ව දෙකක් ද නිමැවුම් ඉදිරිපත් කළේ ය. එක් පාර්ශ්වයක් වූයේ එ වකට ඩයිඩ්රිච්ගේ කර්මාන්තශාලාවේ ප්‍රධානීන් ලෙස කටයුතු කළ ඩයිඩ්රිච්ගේ පුතුන් දෙ දෙනා ය. බර්මින්හැම් මින්ට් (Birmingham Mint) සමාගමේ ප්‍රධානී රැල්ෆ් හීටන් (Ralph Heaton) අනෙක් පාර්ශ්වය නියෝජනය කළේ ය. ප්‍රදර්ශනයේ දී හමු වූ මෙම දෙ පාර්ශ්වය එකඟතාවකට පැමිණි අතර ඩයිඩ්රිච් ගේ තාක්ෂණය උපයෝගී කොට ගෙන පීඩක නිෂ්පාදනය කිරීමට හීටන්ට අවසරය ලැබුණි. එයින් වසර තුනකට පසු 1865 දී බුරුමයේ මන්ඩලේ මින්ට් (Mandalay Mint) සමාගම සඳහා පීඩක නිෂ්පාදනය කිරීම සඳහා හීටන්ට අවස්ථාව උදා විය. හීටන් අන් අය ගේ තාක්ෂණ ආශ්‍රය කොට ගෙන මන්ඩලේ මින්ට් සමාගමට පීඩක නිෂ්පාදනය කළ ද ඒ අතරතුර ඔහු ගේ ම බර්මින්හැම් මින්ට් සමාගමට පීඩක 12 ක් ඔහු නිෂ්පාදනය කළේ ඩයිඩ්රිච් ගේ තාක්ෂණය උපයෝගී කර ගනිමින් ය.

කාසි නිෂ්පාදකයකු වූ ජෝශප් ටේලර් (Joseph Taylor) 1848 දී වැසී ගිය බ්‍රිතාන්‍යයේ සෝහෝ මින්ට් (Soho Mint) සමාගමෙන් කාසි මුද්‍රාවල මුල් නිර්මාණ ලබා ගත්තේ ය. සෝහෝ සමාගමෙන් මුල දී නිෂ්පාදනය කරන ලද කාසි බොහොමයක් මේ නිසා ඔහුට නැවතත් නිෂ්පාදනය කළ හැකි විය. මෙම මුද්‍රා භාවිතයට පෙර ඔහු ඒවා ඔප කොට කැටයම් ලියවූයේ ය. 1852 නොවැම්බර් මාසයේ දී ටේලර් ඕස්ට්‍රේලියාවේ කැන්ගරු ඔෆිස් (Kangaroo Office) සමාගමට පීඩකයක් අපනයනය කළේ ය. ඒ වන විට එම සමාගම අසාර්ථක තත්ත්වයකට ඇද වැටෙමින් තිබිණ. ටේලර් විසින් යවන ලද පීඩකය ද පැරැණි එකක් විය. එ සේ වුව ද කැන්ගරු ඔෆිස් සමාගමේ කළමනාකරු එම පීඩකයෙන් කාසි වර්ග හතරක් නිෂ්පාදනය කිරීමට සමත් විය. 1854 වර්ෂයේ පැවැති



**ටංකිත කාසි ඇසිරීමට පෙර බර කිරමින්**

මෙල්බර්න් ප්‍රදර්ශනයේ දී ඒ සඳහා කැන්ගරු ඔෆිස් සමාගමට සම්මානයක් ද හිමි වුණි. එම කාසි සඳහා මුද්‍රා සාදන ලද්දේ ද ලන්ඩන් නුවර දී ය.

විසි වන සියවය අරම්භයේ දී ජර්මනියට අයත් ෂූලර් (Schuler) නම් සමාගමක් කාසි පීඩක නිෂ්පාදනය කිරීමට පටන් ගත්තේ ය. ෂූලර් පීඩක දැනටත් ලෝකය පුරා භාවිතා වෙයි. මෙම යන්ත්‍රය නිසා කාසි නිෂ්පාදනයට නව තාක්ෂණය


සම්බන්ධ විය. ෂුලර් පීඩකයක ශෛලියේ වූයේ ඉහළ පහළ යන සිරස් අක්ෂයකට තිරස් අතට සපයන හිස් කාසි වෙනුවට තිරස් අක්ෂයකට සිරස් අතට යෙදූ බලයකින් හිස් කාසි සැපයීමයි.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය දශම ක්‍රමයට පරිවර්තනය වීමේ දී නව කාසි සඳහා විශාල අවශ්‍යතාවක් ඇති විය. එයට මුහුණ දීම සඳහා 1950 දී රෝයල් මින්ට් සමාගමේ කාර්මික ශිල්පීහු ඩයිඩ්රිච් ශෛලියේ පීඩක 12 ක් ඔවුන් ගේ වැඩපළෙහි ම නිෂ්පාදනය කළහ. වැඩි දියුණු කළ ද වසර 150 ක් පමණ පැරැණි තාක්ෂණය ම තවදුරටත් ප්‍රයෝජනයට ගැනෙන බව එයින් පැහැදිළි වෙයි. වර්තමානයේ දී ජර්මනිය, ඔස්ට්‍රියාව, බ්‍රිතාන්‍යය, බෙල්ජියම සහ ස්වීඩනය යන රටවල් කාසි පීඩක නිර්මාණය කරයි. කාසි ටංකනය කිරීමේ තාක්ෂණය ලොව පුරා ව්‍යාප්ත ව ඇති නිසා කාසි ටංකන සමාගම් මේවා මිල දී ගනී.

වර්තමානයේ කාසි නිෂ්පාදනය කරනු ලබන්නේ දැඩි පාලනයක් සහ ආරක්ෂාවක් මෙන් ම නිරන්තර අධීක්ෂණයක් ද යටතේ ය. ඒ සඳහා ඇති වගකීම සහතික කිරීමට සහ එයින් වන පාඩුව අවම කර ගැනීමට නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අවස්ථාවක දී ම කාසිවල තත්ත්වය පරීක්ෂාවට ලක් කෙරෙයි. කාසි ටංකනයෙන් පසු සෑම කාසියක් ම පුහුණු තත්ත්ව පාලකවරුන් විසින් පරීක්ෂාවට ලක් කරනු ලබයි.

තත්ත්ව පරීක්ෂාවෙන් පසු ටංකිත කාසි යන්ත්‍ර මාර්ගයෙන් නාමික අගය අනුව ගණනය කොට බඳුන් තුළට දමයි. එම බඳුන් වාහක පද්ධතියක් මගින් මලු තුළට බහා ලන යන්ත්‍ර කරා ගෙන යයි. ඒවා මලු තුළට දමා සීල් කරනු ලබන්නේ එහි දී ය. එයින් පසු එම මලුවල බර මැන කාසිවල නාමික අගය, දිනය, වටිනාකම, අනුක්‍රමික අංක වැනි විස්තර මුද්‍රණය කරයි. එයින් පසු මෙම කාසි මලු නිෂ්පාදන සමාගමේ මුද්‍රාව සහිත දැවයෙන් සෑදූ පෙට්ටිවල අසුරා නැවතත් බර මනිනු ලබයි. අවසානයේ දී මෙම කාසි පෙට්ටි බැංකු වෙත ප්‍රවාහනය කරනු ලැබේ.

මුදල් භාවිතයට පැමිණියේ බාටර් ක්‍රමයේ ගැටලුවලින් අත් මිදීමට කළ උත්සාහය නිසා ය. භාණ්ඩ මුදල් හඳුන්වාදීමෙන් අනතුරු ව එය ඉක්මනින් ම ක්‍රමවත් මුදල් පරිහරණ ක්‍රමයක් දක්වා වර්ධනය විය. පසු කාලයක කඩදාසි මුදල් හඳුනා දුන්න ද අතීතයේ සිට මේ දක්වා ම කාසිවලට ඇති තැන අහිමි වී නැත. දැන් කාසි නිෂ්පාදනය කෙරෙන්නේ භාණ්ඩ හුවමාරුව සඳහා යොදාගන්නා විනිමය මාධ්‍යයක් ලෙසින් පමණක් ම නො වේ. කාසි භාවිතය තුළ යම් යම් අවශ්‍යතා උදෙසා කාසි එක්රැස් කරන්නෝ ද බිහි වී සිටිති. ඒ සමඟ ම, විධාකාරයෙන් කාසි නිපදවීම ද සිදු කෙරෙයි. ඇත්තෙන් ම කාසි නිපදවීමේ මූලික පරමාර්ථය වනුයේ සංසරණය සඳහා එක් කිරීම ය. එහෙත් සංසරණය සඳහා නො වන කාසි ද නිපදවෙයි. මේ හා සම්බන්ධයෙන් විමසීමට ඇති කාරණා ද අති විශාල ය. ඒ සඳහා මෙහි ඉඩක් නැත. ඉදිරි ලිපියකින් ඒ සියලු කරුණු සාකච්ඡාවට ලක් කෙරෙනු ඇත.✪



**ස්කුරුප්පු පීඩකයකින් කාසි ටංකනය කරන පිරිසක්**

# විදේශ විනිමය වෙළෙඳපොළ හා සම්බන්ධිත ව්‍යුත්පන්න

**කේ ඩී ආර් පියතිලක**

සන්නිවේදන දෙපාර්තමේන්තුව

විදේශ විනිමය වෙළෙඳපොළ විවිධ මුදල් වර්ග මිල දී ගැනීම සහ විකිණීම සඳහා ගෝලීය ව ව්‍යාප්තව ඇත. ඉල්ලුම හා සැපයුම අනුව එක් එක් මුදල් වර්ගයේ සාපේක්ෂ මිල මෙම වෙළෙඳපොළ මගින් තීරණය වේ. අන්තර් ජාතික වෙළෙඳාම්, සේවා හා ආයෝජන සඳහා තම රටේ මුදල් වර්ගයට වෙනස් මුදල් වර්ගයකින් ගෙවීම් හා පියවීම් සිදුකිරීමට සිදුවන නිසා විදේශ විනිමය වෙළෙඳපොළ එකකට එකක් අන්තර්ජාතික වශයෙන් සම්බන්ධ ය. ඒවා සන්නිවේදන හා විද්‍යුත් ක්‍රම මගින් ද සම්බන්ධ වී ඇත.

විදේශ විනිමය වෙළෙඳපොළෙහි ප්‍රධාන ගනුදෙනුකරු වන්නේ වාණිජ බැංකු ය. සංචාරකයන් ගේ සිට බහුජාතික සමාගම් දක්වා වන විවිධාකාර ගනුදෙනුකරුවෝ මෙම වෙළෙඳපොළෙහි සේවය ලබති. වාණිජ බැංකු, වාණිජ සමාගම්, මහ බැංකු, ඉදිරි රැකුම් අරමුදල් සහ සමපේක්ෂයෝ ආයෝජන කළමනාකරණ සමාගම්, විදේශ විනිමය හුවමාරු කරන්නෝ, බැංකු නොවන විදේශ විනිමය සමාගම්, මෙ ලෙස විදේශ විනිමය වෙළෙඳපොළට සහභාගි වෙති. මොවුහු නියෝජකයෝ (Principals) හෝ නියෝජිතයෝ (Agents) යන දෙයාකාරයෙන් ම කටයුතු කරති. විදේශ විනිමය වෙළෙන්දෝ අනෙකුත් පාර්ශ්වයන් සඳහා ද ගැනීම්, විකිණීම් කරති. මිල දී ගැනීමේ දී හා විකිණීමේ දී මෙය ගනුදෙනු ආන්තිකයක් (එනම් ලාභයක්) ඇති ව සිදුකරනු ලබන අතර එයට අමතර ව ගාස්තුවක් හෝ කොමිස් මුදලක් ද අයකරනු ලබයි. මෙයට අමතරව විනිමය අනුපාතික වෙනස්වීම් අධ්‍යයනය කරන විදේශ විනිමය වෙළෙඳපොළ ප්‍රධානීහු (එනම් නියෝජකයෝ) විනිමය අනුපාතික සංචලනවලින් ලාභ ලැබීමේ අපේක්ෂාවෙන් කෙටි කාලීන ව මුදල් වර්ග රඳවා ගැනීම හෝ අපේක්ෂිත අවදානම්වලින් ආරක්ෂාවීමේ පරමාර්ථයෙන් හෝ කටයුතු කරති.

විදේශ විනිමය වෙළෙඳපොළ ඉතා තරඟකාරී වන අතර ආර්ථික හා මූල්‍ය අර්බුදවල දී හා වෙනත් බාහිර කරුණු මත අනපේක්ෂිත ලෙස ඒවායේ වෙළෙඳපොළ පිරිවැටුම වෙනස්විය හැකි ය. එ වැනි තත්ත්වයක දී මූල්‍ය බලධාරීහු (මහ බැංකු) බොහෝ විට විනිමය වෙළෙඳපොළට මැදිහත් වෙති. විනිමය අනුපාතිකවල ඇතිවන අනවශ්‍ය කෙටිකාලීන උච්චාවචන අඩුකිරීම සඳහා මුදල් වර්ග විකිණීමෙන් හෝ මිලට ගැනීමෙන් ඔවුන්ට විනිමය අනුපාතික පහළ දැමීමට හෝ ඉහළ දැමීමට හැකි ය. නිල සංචිත යොදගනිමින් හෝ ජාත්‍යන්තර ව ලබා ගන්නා ණය මාර්ගයෙන් හෝ ඇතැම් විට විදේශීය මූල්‍ය බලධාරීන් සමග මුදල් වර්ග හුවමාරු වැඩපිළිවෙළ මගින් මෙම ගනුදෙනු සඳහා අරමුදල් සපයාගනු ලැබේ.

විදේශ විනිමය වෙළෙඳපොළ ජාලය සති අන්ත හැර දවසේ පැය 24 මුළුල්ලේ ම ක්‍රියාත්මක වේ. මූල්‍ය වත්කම් විශාල ලෙස ගනුදෙනු වන විදේශ විනිමය වෙළෙඳපොළ ඉතා ඉහළ ද්‍රවශීලතාවකින් යුක්ත වන අතර අනෙකුත් ස්ථාවර ආදයම් සහිත වෙළෙඳපොළවල් සමග සසඳන විට පටු ආන්තරයක් සහිත ප්‍රතිලාභවලින් යුක්ත ය. ජාත්‍යන්තර පියවීම් බැංකුව (Bank for International Settlements, BIS) 2010 අප්‍රේල් මස දී කරනු ලැබූ සමීක්ෂණවලට අනුව ගෝලීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි දෛනික සාමාන්‍ය පිරිවැටුම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 3.98 ක් ලෙස ගණන් බලා ඇත. මෙම සාමාන්‍ය දෛනික වටිනාකමෙන් සියයට 37 ක් එ නම් ඇ.එ.ජ. ඩොලර් ට්‍රිලියන 1.49 ක් එතැන් (Spot) විනිමය ගනුදෙනු වූ අතර අනෙකුත් සියලු ම ගනුදෙනු ව්‍යුත්පන්න (Derivatives) වෙළෙඳ ගනුදෙනු විය. ඒවා අතර ඇ.එ.ජ ඩොලර් බිලියන 475 ක් ඉදිරි ගිවිසුම් ද ඇ.එ.ජ ඩොලර් බිලියන 1765 ක් විදේශ විනිමය ගිවිසුම් හුවමාරු (Swaps) ද ඇ.එ.ජ ඩොලර් බිලියන 43 ක් මුදල් හුවමාරු (Currency Swaps) ද ඇ.එ.ජ ඩොලර් බිලියන 207 ක් විකල්ප හා අනෙකුත් ගිවිසුම් ද වේ. මේ අනුව විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය ව්‍යුත්පන්න සඳහා තිබෙන වැදගත්කම පැහැදිලි වෙයි. මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වනුයේ පසු ගිය "සටහන" කලාපයේ "විනිමය අනුපාතිකය සහ විදේශ විනිමය වෙළෙඳපොළ ව්‍යාපාරික පැතිකඩ" යන ලිපියෙන් පෙන්වා දෙනු ලැබූ විදේශ විනිමය වෙළෙඳපොළ සම්බන්ධිත ව්‍යුත්පන්න පිළිබඳ ව විස්තරාත්මක ව සාකච්ඡා කිරීමයි.

## විදේශ විනිමය සම්බන්ධිත ව්‍යුත්පන්න

ව්‍යුත්පන්න යනු යම් භාණ්ඩයක, මූල්‍ය වත්කමක හෝ වෙනත් විචල්‍යයක අනාගත මිල වෙනස්වීම්වලින් ලාභ ලැබීමේ අරමුණින් හෝ ඇතිවිය හැකි අවදානම්වලින් ආරක්ෂාවීමේ අරමුණින් හෝ එම භාණ්ඩය, වත්කම හෝ විචල්‍යය එකඟ වූ මිලකට හෝ වටිනාකමකට මිල දී ගැනීමට හෝ විකිණීමට ඇතිකරන්නා අයිතිවාසිකම් හා බැඳීම් ඇතුළත් ගිවිසුම් ය. මෙම අයිතිවාසිකම් හා බැඳීම් ඇතුළත් ගිවිසුම් පැන නැගී ඇත්තේ ඒවාට පාදක වූ වත්කම් මත නිසා ඒවා ව්‍යුත්පන්න ලෙස නම් කර තිබේ. ව්‍යුත්පන්නවලට පාදක වූ වත්කම් අනුව ඒවා කොටස් වෙළෙඳපොළ ව්‍යුත්පන්න (Equity Derivatives), පොලී අනුපාතික ව්‍යුත්පන්න (Interest Rate Derivatives), භාණ්ඩ ආශ්‍රිත ව්‍යුත්පන්න (Commodity Derivatives), ණය ආශ්‍රිත ව්‍යුත්පන්න (Credit Derivatives) හා විදේශ විනිමය

ව්‍යුත්පන්න (Foreign Exchange Derivatives) යනාදී ලෙස වර්ග කර ඇත. එ මෙන් ම වෙළෙඳපොළ ව්‍යවහාරය අනුව ව්‍යුත්පන්න පහත දැක්වෙන පරිදි කොටස් 4 ට වෙන්කර දක්වා ඇත.

1. ඉදිරි ගිවිසුම් (Forward Agreements)
2. අනාගත ගිවිසුම් (Futures)
3. මනාප/විකල්ප ගිවිසුම් (Options)
4. හුවමාරු ගිවිසුම් (Swaps)

මෙම ව්‍යුත්පන්න විදේශ විනිමය වෙළෙඳපොළ සමග යෙදෙන විට ඒවා නැවත පහත දැක්වෙන පරිදි වර්ග කළ හැකි ය.

එ නම් :-

1. විදේශ විනිමය ඉදිරි ගිවිසුම් (Foreign Exchange Forwards)
2. විදේශ විනිමය අනාගත ගිවිසුම් (Foreign Exchange Futures )
3. විදේශ විනිමය හුවමාරු (Foreign Exchange Swaps)
4. විදේශ විනිමය විකල්ප/මනාප (Foreign Exchange Options)

ජාත්‍යන්තර වෙළෙඳාමේ දී ආනයන හා අපනයන භාණ්ඩවල මිල වෙනස්වීම මත හෝ අනාගත විනිමය අනුපාතික සංචලන මත ලාභ ලැබීමේ අරමුණින් හෝ අවදානම්වලින් ආරක්ෂාවීමේ චේතනාවෙන් හෝ විදේශ විනිමය වෙළෙඳපොළ හවුල්කරුවෝ මෙම ව්‍යුත්පන්න උපකරණ භාවිතා කරති.

## විදේශ විනිමය ඉදිරි ගිවිසුම්

ඉදිරි විදේශ විනිමය ගිවිසුමක් යනු පාර්ශ්ව දෙකක් අතර නිශ්චිත අනාගත දිනයක දී එක් ව්‍යවහාර මුදලක් වෙනුවෙන් වෙනත් ව්‍යවහාර මුදල් වර්ගයක් විකිණීමට හෝ මිල දී ගැනීමට හෝ එකඟතාවක් ඇතිකර ගැනීමයි. මෙ ලෙස එකඟ වූ මිල ඉදිරි විනිමය අනුපාතිකය (Forwards Exchange Rate) ලෙස හඳුන්වනු ලබයි. ඉදිරි විනිමය අනුපාතිකය තීරණය කරනු ලබන්නේ අදාළ වත්කම රඳවා ගැනීමේ පිරිවැය සහ හුවමාරු මුදල් දෙකෙහි පොලී අනුපාතික පරස්පරය මත ය. අදළ මුදල් වර්ග දෙකෙහි ඇති පොලී අනුපාතික වෙනස අනුව ඉදිරි විනිමය අනුපාතිකය තීරණය කරන්නේ අධිමිලක් එකතු කිරීමෙන් හෝ එතැන් මිලෙන් (Spot Rate, එතැන් මිල යනු වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වූ විනිමය අනුපාතිකයයි. මෙම අනුපාතය යටතේ කරනු ලබන ගනුදෙනු උපරිම වශයෙන් ව්‍යාපාරික දින දෙකක් තුළ දී බේරුම් කළ යුතු ය) වට්ටමක් අඩුකිරීමෙනි. උදහරණයක් ලෙස ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂ ව දේශීය මුදලේ මූර්ත පොලී අනුපාතිකය අඩු නම් දේශීය මුදල්වලට සාපේක්ෂ ව ඇමෙරිකානු ඩොලර් සඳහා ඉදිරි අනුපාතිකය තීරණය කරනු ලබන්නේ අධිමිලක් එකතු කිරීමෙනි. මෙ සේ කරන්නේ ගිවිසුම් කාල පරිච්ඡේදය තුළ දී ඩොලර්වලට ලැබිය යුතු නියම පොලිය දේශීය මුදල්වලට ලැබිය යුතු නියම පොලියට වැඩි නිසා දේශීය මුදල්වලට ගෙවන අඩු පොලිය සඳහා වන්දියක් ගෙවීම සඳහා ය (න්‍යාය සටහන බලන්න).

කෙ සේ වුව ද ඉදිරි අනුපාතිකය තීරණය වීම සඳහා රටවල් අතර පොලී ආන්තරය පමණක් නොව ආර්ථිකයන්හි ඇති අවිනිශ්චිතතාව, විනිමය වෙළෙඳපොළ උච්චාවචන, හුවමාරු පිරිවැය, පරිපාලන හා ගනුදෙනු වියදම්, ගනුදෙනුකරුවන්ගේ විශ්වසනීයත්වය සහ වෙළෙඳපොළ අවදානම් යනාදිය ද බලපාන්නේ ය.

**න්‍යාය සටහන :**

දේශීය හා විදේශීය පොලී අනුපාතිකය සමාන විට,

$$r^d = r^f$$

දේශීය පොලී අනුපාතිකයට වඩා විදේශීය පොලී අනුපාතිකය වැඩි වන විට ඉදිරි විනිමය අනුපාතිකය තීරණය වන්නේ අධි මිලක් එකතුවීමෙනි.

$$(1+r^d) = \frac{S}{F}(1+r^f)$$

$$F = S\,\frac{(1+r^f)}{(1+r^d)}$$

මෙහි,

F - ඉදිරි විනිමය අනුපාතිකය

S - එතැන් වෙළෙඳපොළ විනිමය අනුපාතිකය

$r^d$ - දේශීය පොලි අනුපාතිකය

$r^f$ - විදේශීය පොලි අනුපාතිකය

නිදසුන : S - එ.ජ. ඩොලරයට රුපියල් 100/-
$r^d = 6\%$ $r^f = 10\%$ නම්,

එවිට, $$F = \frac{100\,(1+0.1)}{(1+0.06)}$$

$$= 103.77$$

එකතු වූ අධි මිල රුපියල් 3.77 කි.

අනාගතයේ දී අහිතකර ලෙස මිල වෙනස්වීමෙන් ඇතිවිය හැකි අවදානම ආවරණය කිරීම සඳහා ආයෝජකයෝ ඉදිරි ගිවිසුම් යොදාගනිති. කෙ සේ වුව ද විදේශ විනිමය වෙළෙඳපොළ මිල (විනිමය අනුපාතිකය) කුමන දිසාවකට වෙනස් වුව ද ඉදිරි ගිවිසුම කල් පිරෙන දිනයේ දී ගිවිසගත් මිලට ගනුදෙනුව සිදු කළ යුතු ය. ඒ අනුව ඉදිරි වෙළෙඳ ගිවිසුමේ ලාභය හෝ පාඩුව හෝ රඳා පවතින්නේ ගිවිසුම ක්‍රියාත්මක වන දිනයේ දී වෙළෙඳපොළේ ක්‍රියාත්මක ව පවතින මිල අනුවයි. උදහරණයක් ලෙස ආනයනකරුවකු ඇ.එ.ජ ඩොලර් ලක්ෂයක් ඩොලර් 1 ක් රුපියල් 112 කට මිල දී ගැනීමේ මාස 3 ක ඉදිරි ගිවිසුමකට එළඹුනේ යැයි සිතමු. මාස 3 කට පසු ගිවිසුම ක්‍රියාත්මක කරන

විට විනිමය අනුපාතිකය ඩොලර් 1 රුපියල් 113 ක් වුවහොත් ආනයනකරු රුපියල් ලක්ෂයක ලාභයක් ලබන අතර යම් ලෙසකින් මාස 3 කට පසු වෙළෙඳපොළ ක්‍රියාත්මක විනිමය අනුපාතිකය ගිවිසුමට එළඹි දිනයේ තිබූ මුදලට වඩා අතිප්‍රමාණය වුවහොත් (දේශීය මුදලේ අගය ඉහළ යාම) ආනයනකරුට ගිවිසුම ක්‍රියාත්මක කිරීමට සිදුවීම නිසා වෙළෙඳපොළ මිලට වඩා වැඩි මිලක් ගිවිසුම්ගත ආයතනයට ගෙවීමට සිදුවීමෙන් අවාසියක් සිදු වේ.

විදේශ විනිමය ඉදිරි ගිවිසුම් බොහෝ දුරට ආනයන හා අපනයනකරුවන්ට ප්‍රයෝජනවත් ය. එහෙත් ඉහත කී ලෙස අනාගත දිනයක දී විනිමය අනුපාතිකයේ සංචලන පිළිබඳ නිශ්චිත පුරෝකතනයක් කළ නොහැකි බැවින් මෙම ගිවිසුම්වලට එළඹෙන්නන් යම් අවදානමක් දැරිය යුතු ය. බොහෝ ඉදිරි ගිවිසුම් අවුරුද්දකට අඩු කාලයක් සඳහා වූ ඒවා ය. මෙම ගිවිසුම්වල ප්‍රමාණ, මිල ගණන් හා කාලය පාර්ශ්වයන් ගේ එකඟතාවය අනුව ගැලපෙන පරිදි සකස් කර ගත හැකි ය. මුදල් ගලායාමේ අවස්ථාව ඒවා භාරදීමේ දී සිදු වේ. තව ද මෙම ගිවිසුම් සඳහා ද්විතියික වෙළෙඳපොළක් නොමැති අතර ආන්තික අවශ්‍යතා පවත්වා ගැනීමත් හා නිෂ්කාශණ ආයතන ක්‍රියාවලියකට ඇතුළත් නොවන බැවින් ඇතිවන අවදානම ඒ ඒ රටවල නියාමන රාමුව හා නීති පද්ධතීන්ගෙන් ආරක්ෂා වී ඇත.

## විදේශ විනිමය අනාගත ගිවිසුම්

මූල්‍ය අනාගත ගනුදෙනුවක් යනු කිසියම් නිශ්චිත මූල්‍ය උපකරණ සම්මත ප්‍රමාණයක් අනාගත දිනයක දී ගිවිසගත් මිලකට විකිණීමට හෝ මිලට ගැනීමට හෝ ඇති කරගන්නා ගිවිසුමකි. මෙම ගිවිසුම්වල පාර්ශ්ව දෙකට ම බැඳීම් ඇත. මිල දී ගන්නා මිල ගෙවිය යුතු අතර විකුණන්නා වත්කම හෝ භාණ්ඩය හෝ භාරදිය යුතු ය. මෙම ගිවිසුම් බොහොමයක් වෙළෙඳුම් කරන්නේ හුවමාරු පදනම් වෙළෙඳපොළවල ය.

මේ නිසා අනාගත ගිවිසුම් ඉදිරි ගිවිසුම් මෙන් නොව කොන්දේසිවලින් යුක්ත ය. ඒවා පාර්ශ්වයන්ට සාකච්ඡා මගින් වෙනස්කළ නොහැකි අතර මේවා සම්මත ප්‍රමිති සහ ප්‍රමාණවලින් යුක්ත ය. විදේශ මුදල් සඳහා මෙන් ම රත්රන්, භාණ්ඩ, වානේ, කොටස් මිල, දර්ශක, පොලී අනුපාතික යනාදිය සඳහා ද මෙම ගිවිසුම් පවතී. මෙම ගිවිසුම් සුරැකුම් හුවමාරුවල ගනුදෙනුවන අතර එම ගිවිසුම්වලට පදනම් වන අයිතම සහ මිල ගණන් කැඳවන ආකාරය එක් එක් සුරැකුම් හුවමාරුවේ ප්‍රසිද්ධියට පත් කරයි. වෙළෙඳ පාර්ශ්ව විසින් සුරැකුම් හුවමාරුවෙහි ගිණුමක් විවෘත කොට ආන්තික අවශ්‍යතා පවත්වාගෙන යා යුතු ය. මෙම ආන්තික පවත්වාගෙන යනු ලබනුයේ අවදානම් ආවරණය කිරීමේ මූලාශ්‍රයක් වශයෙනි.

සියලු ම ගිවිසුම් නිශ්කාෂණ ආයතනයක් හරහා පියවීම් සිදුවන බැවින් අවදානම් සඳහා ආවරණයක් සහිත ය. අනාගත ගිවිසුම්වලට ද්විතියික වෙළෙඳපොළක් පවතින අතර අනාගත ගිවිසුම් වෙළෙඳාමෙහි ලාභය/එළදව තීරණය වන්නේ අනාගත වෙළෙඳපොළේ මිල සහ සත්‍ය වෙළෙඳපොළේ මිල අතර ඇති වෙනස අනුවයි.

## විදේශ විනිමය හුවමාරු ගිවිසුම්

යම් ව්‍යවහාර මුදලක්, මූල්‍ය සුරැකුමක් හෝ ණය අරමුදලක් වෙනත් ව්‍යවහාර මුදලක්, වෙනත් සුරැකුමක් හෝ ණය අරමුදලක් සමග හුවමාරු ගිවිසුමකට එළැඹීමක් මෙ මගින් සිදු වේ. උදාහරණයක් ලෙස යම් ණය අරමුදලක් එහි මුල් මුදල සහ එයට අදාළ පොලිය ද ඇතුලත් ව ඒ හා සමාන බැඳීම්වලින් යුත් වගකීම්වලින් යුත් වෙනත් ව්‍යවහාර මුදලක් සමග හුවමාරු කිරීමට එකඟවන ගිවිසුමක් ණය අරමුදල් හුවමාරු ගිවිසුමකි. මුදල් වර්ග හුවමාරු ඇතිවන්නේ පාර්ශ්ව දෙකක් මුදල් වර්ග දෙකකින් ගෙන ඇති එක සමාන ණය එම ණයට අදාළ පොලී වගකීම් ද සහිතව හුවමාරු කරගැනීමට ගිවිසගන්නා විට දී ය.

යම් විදේශ ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් වූ මෙ වැනි හුවමාරු ගිවිසුම් විදේශ විනිමය ව්‍යුත්පන්න අතර දක්නට ලැබෙන ව්‍යුත්පන්න වර්ග ලෙස දක්නට ලැබුන ද රටවල් අතර මහ බැංකුවල සිදුවන ද්‍රවශීලතා හුවමාරුවලින් මේවා වෙනස් වේ.

## විදේශ විනිමය මනාප/විකල්ප ගිවිසුම්

විකල්ප ගිවිසුම් ද එකඟ වූ මිලකට අනාගතයේ දී යම් වත්කමක් මිල දී ගැනීමට හෝ විකිණීමට හෝ එකඟවන ගිවිසුම් ය. නමුත් ඉහත කී අනාගත ගිවිසුම් මෙන් මේවා සමමිතික ප්‍රතිලාභ හෝ අවදානම්වලින් යුක්ත නොවේ. විකල්ප ගිවිසුමක් අනුව මිලට ගන්නේ අයිතියක් මිස බැඳීමක් නො වේ. ඒ අනුව විකල්පය සඳහා කුමක් කළ යුතු ද යන්න එ නම් එය ක්‍රියාත්මක කිරීම, විකිණීම හෝ අහෝසි වීමට ඉඩ හැරීම තීරණය කිරීමේ නිදහස ගැණුම්කරුට හිමි වේ. ගැණුම්කරු කුමන තීරණයක් ගත්ත ද විකුණුම්කරු එහි ගැණුම් මිල තබාගනියි.

මුදල් වර්ග සහ මූල්‍ය උපකරණ බොහොමයක් (එ නම් හිමිකම්, කොටස් මිල ගණන්, කොටස් දර්ශක, අනාගත ගනුදෙනු, පොලී අනුපාතික, භාණ්ඩ මිල යනාදිය) සඳහා විවිධ විකල්ප ගිවිසුම් ව්‍යුත්පන්න වෙළෙඳපොළ තුළ දැකිය හැකි ය. විකල්ප මිල දී ගැනීම නිසා අනාගත දිනයක දී ගිවිසගත් කාලයක් වෙනුවෙන් නිශ්චිත පොලී අනුපාතිකයකට ණයට දීමේ හෝ ණය ගැනීමේ හෝ භාණ්ඩයක් මිල සම්බන්ධයෙන් නම් නිශ්චිත මිලකට අනාගත දිනයක දී එම භාණ්ඩ මිල දී ගැනීමේ හෝ විකිණීමේ හෝ විදේශ මුදල් සම්බන්ධයෙන් නම් එකඟ වූ විනිමය අනුපාතයන් යටතේ මුදල් වර්ග මිලට ගැනීමේ හෝ විකිණීමේ අයිතියක් ලැබේ.

මෙම විකල්ප ගිවිසුම් ප්‍රයෝජනවත් වන්නේ වෙළෙඳුම් කරන භාණ්ඩ, සුරැකුම් හෝ විනිමය ගනුදෙනු පිළිබඳ ලැබීම් හෝ ගෙවීම්වල කාලයත් ප්‍රමාණයත් අවිනිශ්චිත වන විට දී ය. එ මෙන් ම, එම ගනුදෙනු ආශ්‍රයෙන් ඇතිවිය හැකි අවදානම්වලින් ආරක්ෂා වීම සඳහා ද විකල්ප ගිවිසුම් ප්‍රයෝජනවත් වේ.

ඒ අනුව විකල්ප ගිවිසුමක් කල් පිරෙන දින හෝ ඊට ප්‍රථම එය ක්‍රියාත්මක කිරීමේ හෝ නො කිරීමේ අයිතිය විකල්පය මිල දී ගන්නාට ලැබෙන අතර ඒ වෙනුවෙන් විකල්පයේ මිල ගිවිසුම මිල දී ගන්නා විසින් විකල්පය ලියන්නා නැතහොත් විකුණුම්කරුට ගෙවිය යුතු ය. මේ අනුව විකල්පයක් මිල දී ගන්නා විට දී ඒවා ගැණුම් විකල්ප (Call Option) හා විකිණීමේ දී විකුණුම් විකල්ප (Put Option) ලෙස හඳුන්වන අතර ගිවිසුම කල් පිරෙන තෙක් ඕනෑ ම වේලාවක ගිවිසුම ක්‍රියාත්මක කිරීමට මනාපය ලැබෙන ගිවිසුම් ඇමෙරිකන් විකල්ප ලෙස හැඳින්වෙන අතර ගිවිසුම කල් පිරෙන දිනයේ දී පමණක් ගිවිසුම ක්‍රියාත්මක කිරීමට මනාපය ලැබෙන ගිවිසුම් යුරෝපීය විකල්ප ලෙස ද හැඳින්වෙයි. මෙම විකල්පවලට සම්බන්ධ වත්කම්වල පවත්නා මිල/ වෙළෙඳපොළ මිල (Current Price/ Market Price) හා ක්‍රියාත්මක මිල හෝ කැපුම් මිල (Exercise Price/ Strike Price) අතර වෙනස

විකල්පවල නෛසර්ගික අගය ලෙස හැඳින්වේ. විකල්පයේ මිල හා නෛසර්ගික අගය අතර වෙනස කාල අගය (Time Value) ලෙස හැඳින්වේ. යම් විකල්පයක ලාභ සහිත බව (In the Money), පාඩු සහිත බව (Out of the Money) හෝ සම මිල (At the Money) යන්න විකල්පයේ වෙළෙඳපොළ පවතින දැන් මිල හා කැපුම් මිලේ වෙනසින් පැහැදිලි කරයි. එ මෙන් ම විකල්පයක වෙළෙඳපොළ මිල (ආශ්‍රිත මිල) වෙනස්වීම නිසා විකල්පයේ මිල වැඩිවීමට ඇති හැකියාව වෙනුවෙන් ගැණුම්කරුවකු නෛසර්ගික අගයට වැඩියෙන් ගෙවීමට සූදානම් අමතර ගණන කාල අගය මගින් පැහැදිලි කරයි. යම් විකල්ප ගිවිසුමක් පරිණත වීමට තිබෙන කාලය අනුව එහි කාල අගය තීරණය වේ.

වෙළෙඳපොළ අවිනිශ්චිතතා සහ මිල වෙනස්වීම් මගින් ඇතිවිය හැකි අවදානම් අවම කර ගැනීම සඳහා ද ඉදිරි රැකුම් (Hedging) ලෙස විකල්ප මිල දී ගැනීමට ආයෝජකයන් පෙළඹෙනු ඇත.


මෙ වැනි විකල්ප අතර මිල උඩත්තිම (Caps), පොලී අනුපාතික උඩත්තිම (Interest Rate Caps), මිල යටත්තිම (Floors) හෝ පොලී අනුපාතික යටත්තිම (Interest Rate Floor) සහ දෙයිම (Collars) වැනි විකල්ප වත්මන් ව්‍යුත්පන්න වෙළෙඳපොළෙහි බහුල ව භාවිත වේ.

## මිල උඩත්තිම (Caps) විකල්ප

මිල උඩත්තිම විකල්පයක් යනු යම්කිසි භාණ්ඩයක, පොලී ගෙවීමක හෝ විනිමය අනුපාතිකයක යම් උපරිම මිල සීමාවක් පිළිබඳ ගිවිසුමකට එළැඹීමයි. වෙළෙඳපොළේ භාණ්ඩවල මිල ගණන් ඉහළයාමේ ප්‍රවනතා අධ්‍යයන කරන වෙළෙඳුන් මෙ වැනි මිල උඩත්තිම විකල්ප ගිවිසුම්වලට එළඹෙනු දැකිය හැකි ය. තෙල් මිල ගණන් පිළිබඳ මිල උඩත්තිම (Oil Price Cap) ගිවිසුමක් එ වැනි විකල්පයකට උදාහරණකි. මෙ වැනි ගිවිසුම්වල දී ගිවිසුමට එළඹෙන පාර්ශ්ව නිෂ්පාදකයාගෙන් වෙනස් විය හැකි ය.

උදාහරණයක් ලෙස ඉදිරි මාස 3 කට තෙල් මිල උඩත්තිමයක් පිළිබඳව බැංකුවක් සමඟ ගිවිසුමකට එළඹෙන තෙල් ආනයන කරන්නකු තෙල් බැරලයක් සඳහා එක්සත් ජනපද ඩොලර් 100 ක උඩත්තිමයක් මාසයකට තෙල් බැරල් 100,000 ක් වෙනුවෙන් ලබාගන්නේ යැයි සිතමු. එ විට ගිවිසුම ලියන්නා විසින් විකල්පයේ මිල ලෙස යම් වාරිකයක් ගිවිසුමට ඇතුළත් කරනු ඇත. ඉහත කී ලෙස තෙල් මිල උඩත්තිම විකල්පයක් මිල දී ගත් පසු රූප සටහනේ දක්වා ඇති පරිදි පෙබරවාරි මාසය තුළ සාමාන්‍ය තෙල් මිල ඇ.එ.ජ. ඩොලර් 105 දක්වා ඉහළ ගියහොත් ගිවිසුම් ගත බැංකුව විසින් මිල උඩත්තිමය වූ ඇ.එ.ජ. ඩොලර් 100 වඩා වැඩි වූ මුදලේ අගය (එ නම්, ඇ.එ.ජ. ඩොලර් 5 x 100,000 ඇ.එ.ජ. 500,000 මුදලක්) විකල්පය ලබාගත් ගැණුම්කරුට ගෙවිය යුතු ය. අනෙක් අතට රූප සටහනේ දක්වන පරිදි ජනවාරි මාසයේ දී සාමාන්‍ය තෙල් මිල ඇ.එ.ජ. ඩොලර් 96 වැනි අගයක පැවතිය හොත් ගැණුම්කරුට ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නොවේ. මක් නිසා ද යත් ඔහුට වෙළෙඳපොළ මිල යටතේ තෙල් ආනයනය කළ හැකි බැවිනි. එ මෙන් ම ගිවිසුම්ගත කාලය තුළ දී තෙල් මිල දිගට ම මිල උඩත්තිමයට වඩා පහළ වැටුන හොත් ආනයනකරුට වෙළෙඳපොළ මිල යටතේ තෙල් ආනයනය කළ හැකි ය. මෙහි දී ආනයනකරු විසින් ගිවිසුමට එළැඹුන බැංකුවට ගෙවන ලද වාරික මුදල ඔහුට සිදුවන පාඩුවයි.

**රූපසටහන**




## යටත්තිම (Floor) විකල්ප

මිල ගණන් පිළිබඳ පහළ සීමා ඇතුළත් එකඟතා යටත්තිම ගිවිසුම් වශයෙන් හැඳින් වේ. පොලී අනුපාතික, විනිමය අනුපාතික, භාණ්ඩ මිල පිළිබඳ පහළ සීමා සඳහා වන ගිවිසුම් මේ යටතේ දැක්විය හැකි ය. මෙම ගිවිසුම්වල දී සිදුවන්නේ ගිවිසුම් ගත මිලට වඩා මිල අඩු වුවහොත් එම මිලේ වෙනස විකල්ප ගැනුම්කරුට ගෙවීමට සිදුවීමයි.

උදාහරණයක් ලෙස තෙල් සපයන්නකු ඉදිරි මාස 3 ක් සඳහා යටත්තිමය ඇ.එ.ජ. ඩොලර් 90 වූ විකල්ප ගිවිසුමක් මූල්‍ය ආයතනයකින් මිල දී ගත්තේ යැයි සිතමු. එ වැනි ගිවිසුමක් යටතේ වෙළෙඳපොළ තෙල් මිල ඇ.එ.ජ. ඩොලර් 90 ට අඩුවුවහොත් එම යටත්තිම විකල්පය මිල දී ගත් පුද්ගලයාට එම විකල්ප මිලේ වෙනස ලබාගත හැකි ය. රූප සටහනේ දැක්වෙන පරිදි මාර්තු මාසයේ දී වෙළෙඳපොළේ තෙල් මිල ඇ.එ.ජ. ඩොලර් 90 ට වඩා අඩු වී ඇති බැවින් එම මිලේ වෙනස ඔහුට ලබාගත හැකි ය. ජනවාරි හා පෙබරවාරි මාස සඳහා විකල්පය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවක් නොමැති අතර එම කාලය තුළ දී ඔහු වෙළෙඳපොළ මිල යටතේ තෙල් සපයනු ලබයි.

## දෙයිම (Collar) විකල්ප

දෙයිමයක් යනු උඩත්තිම සහ යටත්තිම දෙකෙහි සංකලනයකි. මේවා පොලී අනුපාතික හෝ භාණ්ඩ මිල ගණන් ආදිය හෝ සඳහා යොදගත හැකි ය.

උදාහරණ ලෙස තෙල් ආනයනකරුවකු තෙල් මිල ගණන් පිළිබඳව ගිවිසුම් පිරිවැයක් නැති (Zero Cost) මාස තුනක දෙයිමයක් ගත්තේ යැයි සිතමු. රූපසටහනේ දක්වා ඇති පරිදි එහි මිල උඩත්තිමය ඇ.එ.ජ. ඩොලර් 100 ක් ද මිල යටත්තිමය ඇ.එ.ජ. ඩොලර් 90 ක් ද නම් යම් ලෙසකින් වෙළෙඳපොළේ තෙල් මිල ඉදිරි මාස තුන ඇතුලත ඇ.එ.ජ. ඩොලර් 100 ට වඩා වැඩි වුවහොත් එම මිලේ වැඩි වූ වෙනස ගිවිසුම්ගත බැංකුව විසින් දෙයිමය ගත් ආයෝජකයාට ගෙවිය යුතු ය. යම් ලෙසකින් වෙළෙඳපොළේ තෙල් මිල යටත්තිමයට (ඇ.එ.ජ. ඩොලර් 90) පහළ ගිය හොත් එම අගයට වඩා අඩු වූ මිල ගිවිසුම ගත් තෙල් ආනයනකරු විසින් බැංකුවට ගෙවිය යුතු ය.

## ව්‍යුත්පන්නවල ප්‍රයෝජන

ආයෝජකයන්ට තම ආයෝජන වෙනස් කිරීමේ හැකියාවක් ව්‍යුත්පන්න නිසා ඇති වේ. මූල්‍ය ආයතන බහුජාතික සමාගම් විවිධ මුදල් වර්ගවලින් සිදුකර ඇති ආයෝජන මුදල් වර්ගවල මිල වෙනස්වීම්වලට අනුව හා තම ආයෝජන කළඹේ ඇති ව්‍යුත්පන්න හෝ ඒවාට පාදක වූ වත්කම්වල ආකර්ෂණීයභාවය පිළිබඳ ඇති වන වෙනස්කම් අනුව වරින්වර ආයෝජන වෙනස් කරනු ඇත. ව්‍යුත්පන්න නො තිබුනේ නම් ඔවුන්ට තම ආයෝජන කළඹ වෙනස් කළ හැකි එක ම ස්ථානය වන්නේ මුදල් වෙළෙඳපොළයි.

ව්‍යුත්පන්න වෙළෙඳපොළ මිල අනාවරණ වෙළෙඳපොළ හැටියට කටයුතු කරයි. ආයෝජකයන් ව්‍යුත්පන්න තම ආයෝජන කළඹට ඇතුලත් කර ගන්නේ වෙළෙඳපොළ අනාගත මිල සංචලනවලින් ලාභ ලැබීමට හෝ අවදානම්වලින් ආරක්ෂා වීම සඳහා ය. උදාහරණයක් ලෙස ඉදිරියේ දී විනිමය අනුපාතිකවල සංචලන අපේක්ෂා කරන ආනයනකරුවන් හෝ අපනයනකරුවන් ඉදිරි ගිවිසුම්වලට එළඹෙනු ලබන්නේ විනිමය අනුපාතික සංචලනවලින් ලාභ ලැබීමට හෝ අවදානම්වලින් ආරක්ෂා වීමට ය.

ඉදිරි විනිමය අනුපාතික අනාගතයේ දී ඇතිවිය හැකි තැන් අනුපාතිකය පිළිබඳ පූර්ණ ප්‍රතිබිම්බයක් නොවුනත් අනාගතයේ දී ඇතිවිය හැකි තැන් අනුපාතිකය පිළිබඳ සංඥවක් ලබා දෙයි. ඒ මෙන් ම බොර තෙල් ආනයනකරුවකු වෙළෙඳපොළ තෙල් මිල උපනතීන් අධ්‍යයනය කර බොරතෙල් පිළිබඳ ඇතිකරගන්නා විකල්ප ගිවිසුම් මගින් අනාගත තෙල් මිල පිළිබඳ සංඥ වෙළෙඳපොළට ලබාදෙයි. මේ නිසා ව්‍යුත්පන්න වෙළෙඳපොළ මිල අනාවරණ වෙළෙඳපොළ ලෙස කටයුතු කර මුදල් වෙළෙඳපොළට සංඥ සැපයීමට ඉඩ ඇත.

ව්‍යුත්පන්න වෙළෙඳපොළ ආයෝජකයන්ට අවදානම් ආවරණය කිරීමේ මාධ්‍යයක් සපයයි. විශේෂයෙන් ඉදිරි රැකුම් උපකරණ (Hedging Instruments) වෙළෙඳපොළේ මිල වෙනස්කම්වලින් ඇතිවිය හැකි බලපෑම හැකිතාක් දුරට ඉවත් කිරීමට යොදගනී. බොහෝ ඉදිරි ගිවිසුම් ද මිල වෙනස්කම් නිසා ඇතිවිය හැකි අවදනම් ආවරණය කිරීමේ උපායන් ලෙස යොදගනී. එහෙත් සමහර ආයෝජකයන් අවදනම් දරමින් අධික ලාභ ලැබීමේ පරමාර්ථයෙන් කටයුතු කරන හා දිගු කාලීන පිහිටුම් ගනිමින් වත්කම් විශාල ලෙස දරා සිටිමින් තම ප්‍රතිලාභ ඉහළ දැමීමට කටයුතු කිරීම ද ව්‍යුත්පන්න වෙළෙඳාමේ දැකිය හැකි ය.

මූල්‍ය වෙළෙඳපොළ ආයතනික රාමුව දියුණුවීමක් ද ව්‍යුත්පන්න වෙළෙඳාම නිසා සිදු වේ. ව්‍යුත්පන්න වෙළෙඳ ගනුදෙනු සඳහා සංවිධිත හා ඉතා දියුණු මූල්‍ය ආයතන පද්ධතියක් අවශ්‍ය ය. තැරව්කාර ආයතන, නිශ්කාෂණ ආයතන, ගබඩා පහසුකම්, වෙළෙඳ ගිණුම් පවත්වා ගැනීම හා පරිගණක තාක්ෂණය සහිත වූ ක්‍රියා පද්ධතිය මේ සඳහා අවශ්‍ය වේ. මේ නිසා මූල්‍ය වෙළෙඳපොළ ගෝලීයකරණය වීමත් නවෝත්පාදනවලට යොමුවීමත් දැකිය හැකි ය.

මෙයට අමතරව වෙළෙඳපොළ මිල ආන්තික අඩුවීම, වත්කම් ප්‍රත්‍යාගණනය, බැංකු ණය පහසුකම් දියුණුවීම, වෙළෙඳපොළ පිරිවැටුම ඉහළයාම, විදේශීය ආයෝජන වර්ධනය වීම යනාදී සාධක ද ව්‍යුත්පන්න වෙළෙඳාම නිසා අත්පත් කර හැකි වාසි වෙයි. ❂

# නව වදන් තනමු

පසුගිය වසරේ ජූනි 11 වැනි දා අභාවප්‍රාප්ත වූ නෝමන් මැක්රේ (Norman Macrae) බ්‍රිතාන්‍යයේ සිටි ඉතා සුප්‍රසිද්ධ ආර්ථික විද්‍යාඥයෙකි. ජනමාධ්‍යවේදියෙක් සහ ග්‍රන්ථ කර්තෘවරයෙක් ලෙසින් ද ඔහු නමක් දිනාගෙන සිටියේ ය. 1949 වර්ෂයේ දී මැක්රේ The Economist සඟරාවට සම්බන්ධ විය. එයින් වසර 39 කට පසු - 1988 දී, ඔහු විශ්‍රාම ලබන විට එහි උප කර්තෘවරයෙක් වශයෙන් කටයුතු කරමින් සිටියේ ය.

ඔහු ව අගය කෙරී ඇත්තේ අනාගතය දුටු කෙනකුන් ලෙසට හා ආර්ථික විද්‍යා විෂයය ක්ෂේත්‍රයට අවශ්‍ය කෙරෙන නව වදන් නිපද වූ කෙනකු ලෙසිනි. Stagflation (ඉල්ලුමේ අනුරූපී වර්ධනයක් රහිත උද්ධමනය), Intrapreneurship (දැවැන්ත ආයතනයවල සේවකයන් තුළ පවත්නා ව්‍යවසායකත්වය), Privatisation (පුද්ගලිකකරණය) සහ Eurocrat (යුරෝපා සංගම් මූලස්ථානයේ සිටින පරිපාලන නිලධාරීන්) යන පාරිභාෂික වචන ඔහු ගේ නිපැයුම්.

අප ඉදිරියට යන විට භාෂාව ද ඒ හා සමඟ ම වර්ධනය විය යුතු ය. නවමු දේ අර්ථාන්විත ව පැවසීමට නව වචන නිපදවිය යුතු වේ. මෙ වර "සටහන" ඒ සඳහා වන මුල් පියවරක් තබා ඇත. ඒ, මූල්‍ය ව්‍යුත්පන්න සඳහා යොදාගත හැකි නව වදන් තුනක් තැනීමෙන්. මේ වදන් තුන නිපදවා ඇත්තේ ඉදිරි රැකුම් (Hedging) ආශ්‍රිත කරුණු විස්තර කිරීම සඳහා මෑතක දී භාවිතයට ආ ඉංග්‍රීසි යෙදුම්වලට පර්යාය වශයෙන්. ඒ වචන තුන වන්නේ Cap, Floor හා Collar ය.

Cap යන්නෙන් කියැවෙන්නේ ඉහළ සීමාවකි. එ නම් උඩත් ඉමකි. අපි එයට **උඩත්තිමය** යැයි කියමු.

ඒ අනුව ම යමින් Floor යන්න සඳහා **යටත්තිමය** යැයි කියමු.

Collar යැයි කියන විට එයින් අදහස් කරන්නේ උඩත්තිමක් හා යටත්තිමකින් සීමා වන්නකි. එ නම් දෙ ඉමකි. ඒ නිසා අපි එයට **දෙයිමය** යැයි කියමු. ❂

**- සංස්කාරක**

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.